# 2023/03/14 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2023/03/14 දින පෙ.ව. 09.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

සහභාගී වූ

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | සුහාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 16. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 17. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 18. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 19. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 20. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 24. | ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක | ගරු මන්ත්‍රිනී |

සහභාගි නොවූ

| | | |
|---|---|---|
| 01. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 02. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 03. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2023.03.14 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02.** **මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. මේ වර්ෂයේ තෙවන සභාවාරය අද දින පවත්වන්නෙ ඒ වගේම නීත්‍යානුකූල අවසන් සභාවාරයත් මෙම සභාවාරයම තමයි.ඉදිරි පළාත් පාලන ජන්ද විමසීම පැවැත්වීමට නියමිතව තිබෙනව විවිධ පක්ෂ වලින් අපි ජන්දය ඉල්ලුවත් විවිධ ගැටලුකාරී තත්ත්වයන්ට පත් නොවී අපි එකාවන්ව කටයුතු කරයි කියල බලාපොරොත්තු වෙනව. ඒ අනුව අද දින මහා සභා රැස්වීමට සපැමිණි ඔබතුමන්ලා සහ ඔබතුමියන්ලා මම ඉතා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එහෙමනම් වෙනදා වගේ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරමු.

**(අ)01. 2023.02.14 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත.

2023.02.14 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

අද දින ගරු එම්.එම්.දිසානායක මහතා ,ධර්මසිරි ගනේවත්ත මහතා ,විලේගේ අමර ධනංජය මහතා සහභාගි නොවන බවත් එතුමන්ලාගේ නිවාඩු අනුමත කර දෙන ලෙසත් දුරකථනයෙන් දැනුම්දෙනු ලැබුව එම නිවාඩු අනුමත කරදෙන ලෙස ගරු සභාවට යෝජනා කර සිටිනව ,

ඒ අනුව ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා විසින් ගරු එම්.එම්.දිසානායක මහතා ධර්මසිරි ගනේවත්ත මහතා ,විලේගේ අමර ධනංජය මහතා 2023.03.14 දින නිවාඩු අනුමත කරන ලෙස ගරු සභාවට කළ යෝජනාව ගරු උපසභාපති එම් .කේ.ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාසම්මතවිය.

**(ඇ). සංදේශ, පෙත්සම්, පැමිණිලි ,ලිපි ඉදිරිපත් කිරීම**

01. මාපලගම මදින්නාගොඩ ජනතාව විද්‍යා තිලක විහාරස්ථානයට අයත් ඉඩමෙන් මාර්ගයක් භාවිතා කරන ලද අතර එම මාර්ගය වසාදමා නායක ස්වාමීන් වහන්සේ විසින් ඉඩමෙන් වෙනස් ස්ථානයක අඩි 08 ක් පළල පාරක් සකස්කර දෙන ලද බවත් එම මාර්ගය සභාවේ ලියාපදිංචි පාරක් ලෙස ගැසට් කරදෙන ලෙසත් මදින්නාගොඩ ගම්වාසීන්,ඇතුමලේ,මාපලගම.විසින් එවන ලද 2023.03.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**
නැත.

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

01. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාල වාර්තාව පිළිගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

02. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනාව සම්මත වීමෙන් අනතුරුව තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අපහරණ හා වෙන්දේසි කමිටුවට මන්ත්‍රීවරුන් තිදෙනෙක් පත් කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිරකරන ලදී.**

**ඒ අනුව අපහරණ හා වෙන්දේසි කමිටුව සඳහා ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය, ගරු මන්ත්‍රිනී ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මහත්මිය සහ ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා සුදුසු බවට ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රි රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

03. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමීක්ෂණයෙන් ඉවත් කරනු ලබන භාණ්ඩ වෙන්දේසි කිරීමට දිනයක් ලබා ගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරන ලදී.**

**මේ සම්බන්ධයෙන් මාර්තු 20 දින සුදුසු යැයි ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කරනු ලද අතර ගරු උප සභාපති එම්.කේ.ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.**

04. සභාව විසින් ලබා දෙනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රය සඳහා දැනට රු.3000.00ක් අය කරන අතර, පරිසර ආරක්ෂණ බලපත්‍රය අවලංගු වන දිනට මාස 3 කට පෙර නැවත අලුත් කිරීම සඳහා යොමු කල හොත් රු. 3000.00 ක මුදලක් සහ බලපත්‍රය අවලංගු වන දිනයට පසු නැවත අලුත් කිරීම සඳහා රු. 4500.00 ක මුදලක්ද අය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

05. කේ.එච්.එම් .ඉනෝකා දමයන්ති මිය විසින් උඩුගම පොළ ටෙන්ඩර් කිරීමේදී අයකරන ලද ආපසු ගෙවීමේ තැම්පතු මුදල වන රු. 5000/- සහ ආරක්ෂිත ඇප තැම්පතු මුදල වූ රු.155000/- ක මුදල ආපසු ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

**06.** **ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

<u>නාගොඩ ප්‍රාදේශීය සභාව</u>

<u>**2023.03.14** වන දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව</u>

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

I. 2023 පෙබරවාරි මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු. 81,000.00

**02. මහජන බැංකුවේ ලංකා විදුලිබල මණ්ඩල ගිණුම විදුලි බිල්පත් පියවීම**

**2023 පෙබරවාරි**

2809093105 - කොම්පෝස්ට් ව්‍යාපෘතිය - රු. 2406.85
8616374000 - උඩුගම ටොයිලට් කම්පෙලෙක්ස් - රු. 4721.03
8616373802 - උඩුගම පොළ -රු. 787.70
8619142704 - රන් කැකුලු පෙර පාසල (2022,පෙබ. ) - රු. 375.09
2810125104 - දීප්ති පෙර පාසල - රු. 798.29

**03. චන්දිමා සෙනෙවිරත්න මිය, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව** - රු. 9,164.66

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **sp/psc/07/01/08(37)** හා 2022.02.07 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් 2023 පෙබරවාරි මස දීමනා ගෙවීම

**04. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල**

2010 වර්ෂය සඳහා හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10,000.00

**05. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී දුරකථන බිල්පත් පියවීම**

**I. ප්‍රධාන කාර්යාලය 0912296537 - රු. 3902.40**
**II. ප්‍රධාන කාර්යාලය0912296433 - රු.2602.28**
**III. මාපලගම උප කාර්යාලය - රු. 574.40**

**06. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් හා දිස්ත්‍රික් කාර්යාලය ඇල්පිටිය** 2022 සැප්තැම්බර්,ඔක්තෝම්බර්,නොවැම්බර්, දෙසැම්බර් නාගොඩ ප්‍රාදේශිය සභාව වෙනුවෙන් මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීමට අදාළ ගෙවීම් - රු.1300.00

**07. කේ.පී. ප්‍රදීපා නිල්මිණී,රිවර් ෆෙයා, නාගොඩ, ගාල්ල**

නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා 2023 මාර්තු මස බදු කුලිය ගෙවීම - රු.6,000.00

**08. නීතීඥ හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, අංක 24, ලේන්බාන් වීදිය, කොටුව, ගාල්ල** 2023.02.15 නඩු අංක 15977 නඩුවට අදාළව නීතීඥ පෙනීසිටීමේ ගාස්තු, -රු.4000.00

**09. ජේ.පී. කොමියුනිකේෂන්, නාගොඩ.**

2023 පෙබරවාරි මස සභා වාර්තා පිටපත් 28ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම - රු3040.00

**10. ඒ.කේ.නිලන්ති සජීවනී මිය, ග්‍රාෆ්ටෙල් කම්යුනිකේෂන්, යටලමත්ත**

2023 පෙබරවාරි මස මන්ත්‍රීවරුන් සඳහා දුරකතන කාඩ්පත් ලබා ගැනීමේ බිල්පත -රු.28,500.00

**11.** ශ්‍රීනිත් රුක්ෂාන් මයා, සමගිගම, උඩුගම

උඩුගම මහජන පුස්තකාලය සඳහා මස පුවත්පත් මිළදී ගැනීම 2023 පෙබරවාරි - රු. 8,570.00

**12.** ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත
නාගොඩ මහජන පුස්තකාලය සඳහා 2023 පෙබරවාරි මස පුවත්පත් මිළදී ගැනීම - රු.11660.00

**13.** බී.ජේ.කරුණාරත්න, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් මිළදී ගැනීම 2023 පෙබරවාරි - රු. 7380.00

**14.** ඩී.එච් ප්‍රනාන්දු සීගිරි හොටෙල් සීගිරි හොටෙල් ,නාගොඩ - රු. 2020.00
2023.02.21 කම්පියුටර් පරීක්ෂාවට පැමිණි නියාගම වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ
කාර්යය මණ්ඩලයට සංග්‍රහ වියදම් - රු.550.00
2023.03.02 මුදල් කමිටුව සඳහා සංග්‍රහ වියදම් - රු.770.00
2023.01.05 ප්‍රසම්පාදන කමිටුව සඳහා සංග්‍රහ වියදම් - රු.220.00
2023.01.27 ප්‍රසම්පාදන කමිටුව සඳහා සංග්‍රහ වියදම් - රු.480.00

**15.** **ලංකා තෙල් පිරවුම්හල, නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ඉන්ධන ලබා
ගැනීමේ බිල්පත පියවීම 2023 ජනවාරි - රු. 492,725.00

| දිනය | වාහන අංකය | ඇණවුම් අංකය | වර්ගය | ප්‍රමාණය (l) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 2023.01.02 | PF 7360 කැබ්රථය | 789776 | ඩීසල් | 55 | 23,100.00 |
| 2023.01.05 | | 789779 | | 52 | 21,060.00 |
| 2023.01.09 | | 789780 | | 52 | 21060.00 |
| 2023.01.11 | | 789783 | | 54 | 21,870.00 |
| 2023.01.13 | | 789785 | | 55 | 22275.00 |
| 2023.01.16 | | 789789 | | 58 | 23490.00 |
| 2023.01.19 | | 789791 | | 53 | 21465.00 |
| 2023.01.22 | | 789792 | | 55 | 22,275.00 |
| 2023.0126 | | 789795 | | 58 | 23,490.00 |
| 2023.01.28 | | 789797 | | 59 | 23,895.00 |
| 2023.01.30 | | 789799 | | 20 | 8100.00 |
| | | | **එකතුව** | **571** | **2,32,080.00** |
| 2023.01.02 | LL 7650 කෘ කැබ් රථය | 789777 | ඩීසල් | 50 | 21,000.00 |
| 2023.01.12 | | 789784 | | 50 | 20,250.00 |
| 2023.01.26 | | 789796 | | 50 | 20,250.00 |
| | | | **එකතුව** | **150** | **61,500.00** |
| 2023.01.09 | LL 7366 ට්‍රක් ජල බවුසරය | 789781 | ඩීසල් | 50 | 20,250.00 |
| 2023.01.29 | | 789798 | | 50 | 20,250.00 |
| | | | **එකතුව** | **100** | **40,500.00** |
| 2023.01.02 | SPRA 8570 ට්‍රැක්ටරය | 789774 | ඩීසල් | 40 | 16,800.00 |
| 2023.01.09 | | 789782 | | 40 | 16,200.00 |
| 2023.01.15 | | 789787 | | 35 | 14,175.00 |
| 2023.01.19 | | 789790 | | 30 | 12,150.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2023.01.26 | | 789793 | | 40 | 16,200.00 |
| 2023.01.31 | | 789800 | | 40 | 16,200.00 |
| | | | | **225** | **91,725.00** |
| 2023.01.02 | 252- 6478 කැබ් රථය | 789775 | ඩීසල් | 40 | 16,800.00 |
| 2023.01.13 | | 789786 | | 60 | 24,300.00 |
| | | | | **100** | **41,100.00** |
| 2023.01.13 | | 789786 | පවර් ඔයිල් | මිලි ලීටර් 500 | 1,220.00 |
| 2023.01.26 | SPRD 1637 | 789794 | DS 40 Oil | 9L | 13,500.0 |
| 2023.01.01 | සභා වාර්තා බෙදා දීම සඳහා | 789778 | පෙට්‍රල් | 5L | 1,850.00 |
| 2023.01.16 | ගබඩා කර තබා ගැනීම සඳහා | 789788 | පෙට්‍රල් | 25 | 9,250.00 |
| | | | **මුළු එකතුව** | **1185 L 500ml** | **492,725.00** |

**<u>2023.01.03 සිට 2023.01.31 දින දක්වා සංශෝධිත මිළ ක්‍රියාත්මක වේ</u>**

**16. ඇක්වසොෆ්ට් ප්‍රයිවට් ලිමිටඩ්, එල්.ටී.ඩී.**

ඊ සභා මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමට අදාළව 2023.03.01- 2024.01.31 දින දක්වා ගිවිසුමට අදාල ගෙවීම් සිදු කිරීම - රු. 57,750.00

**17. ලංකා හොස්ට් වෙබ් සොලියුෂන් ප්‍රයිවට් ලිමිටඩ්, කිරිබත්ගොඩ**

Nagodaps.lk වෙබ් අඩවිය සඳහා 2023.03.02 සිට 2024.03.01 දින දක්වා Domain name හා Domain renewal සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම - රු. 8,500.00

**18. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පුද්ගලික සමාගම, කොළඹ 02**

ආයතනයේ භාවිතා කරන ගෙස්ටෙට්නර් ඡායා පිටපත් යන්ත්‍රයේ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් බිල්පත පියවීම - රු. 144,900.00

**19. වාසනා ඩීලර්ස්, ගාල්ල**

වීථි පහන් ආලෝකකරණය සඳහා අවශ්‍ය 12.5w බල්බ් සහ 2 pin හෝල්ඩර් ලබා ගැනීමේ බිල්පත - රු. 138,000.00

**20. ඒ.එල්.ජී. දිනිදු මයා, උඩුගම**

ගබඩාව සඳහා අවශ්‍ය ඉදල්මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත - රු. 4,400.00

**21. ඩී.ජී. කැළුම් පුෂ්පකුමාර මයා, උඩුගම මෝටර් ඉංජිනියර්ස්, උඩුගම**

SPLL 7650 කෘ කැබ් රථයේ තිරිංග පද්ධතියේ අළුත්වැඩියාව සම්බන්ධ බිල්පත - රු. 19,850.00

**22. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**

i. SPPF 7360 කැබ් රථයේ හෙඩ් ලයිට් බල්බය සහ හෝල්ඩරය දැමීමේ බිල්පත - රු. 3,175.00
ii. SPPF 7360 කැබ් රථයේ පිටුපස බ්‍රේක් ලයිනර් අලුතින් දමා සැදීමේ බිල්පත - රු.31,850.00

**23. කළමනාකරු, නිපෝන් වෙයින් ඉනටර්නැෂනල්, ගාල්ල**

**ඇප්තොප්වත්තෙහි කොම්පෝස්ට් පොහොර පැකට් කිරීම සඳහා අවශ්‍ය තරාදියක් මිළදී ගැනමේ බිල්පත - රු. 26,500.00**

**24. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

i. ප්‍රාදේශීය සභාවේ වාහන සේදීම සඳහා අවශ්‍ය හෝස් ආදිය සහ ගබඩාව සඳහා අවශ්‍ය ඉටි තාච්චි මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත පියවීම - රු. 4,410.00

ii. මාපලගම ආයුර්වේදයේ බෙහෙත් ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා අවශ්‍ය ඉටිකොළ 02 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 2,500.00

**25. කේ.ජී. රුවන් චමින්ද මයා, එච්. බී. ඉංජිනේරින්, උඩුගම**

සභාව සතු තණකොළ කපන මැෂින් 03 අලුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 46,935.00

**26. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය, ආනන්දගිරි, නාගොඩ , ගාල්ල**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී දීමනාව ගෙවීම 2023 පෙබරවාරි - රු. 14,500.00

**27. සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10**

නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර ගාස්තු - රු. 15,600.00

**28. 2023 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | | |
|---|---|---|---|
| I. | කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ නිලධාරී | - රු.5,500.00 |

**29. 2023 මාර්තු මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | | |
|---|---|---|---|
| I. | ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු 640.00 |

**2023 පෙබරවාරි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | | |
|---|---|---|---|
| I. | නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | - රු.3,000.00 |
| II. | එච්.එම්. හේවාවිතාරණ මිය | - කළමනාකරණ සහකාර | - රු. 350.00 |
| III. | එම්. ඒ. වසන්ත මයා | - රියදුරු | - රු. 4,200.00 |

**30. අතිකාල දීමනා ගෙවීම්**

**2023 පෙබරවාරි මස**

| | | |
|---|---|---|
| එච්.එම්. හේවාවිතාරණ මිය | - කළමනාකරණ සහකාර | - රු. 1,549.00 |
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9,226.40 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 5,764.68 |
| කේ. එච්.එම් නිශාන්ත ඉඳුනිල් | - රියදුරු | - රු. 8,596.00 |
| කේ.එච්.එම්. කැළුම් චාමර | - රියදුරු | - රු. 1,182.03 |
| ඩී.ටී.ආර්.ජේ. තරිඳු ගුණරත්න මයා | - මුරකරු | - රු. 6,617.18 |
| ඩබ්.ජී. දයානන්ද මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 1,324.92 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.5,963.47 |
| එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | - රු. 5,759.35 |
| චතුරානි පතිනායක මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1,623.41 |
| කේ.ජී.හර්ෂ චාමර සම්පත් මයා | - සෞඛ්‍ය කම්කරු | -රු. 2,601.78 |
| එම්. ඩබ්. හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | -රු. 5741.49 |
| යූ.ජී. ආසිරි අභය කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 3,031.20 |

**31. <u>අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2023 ජනවාරි මස</u>**

එච්.එම්. හේවාවිතාරණ මිය - කළමනාකරණ සහකාර - රු. 790.98

**ඒ අනුව අංක 01 සිට 31 දක්වා ඇති ඉදිරි ගෙවීම් අතුරින් 22 ii කරුණ හැර ඉතිරි ඉදිරිගෙවීම් සියල්ල සහා අරමුදලින් ගෙවීමටත් 22 ii ඉදිරිගෙවීම වැඩිදුරටත් පරීක්ෂා කොට ගෙවීමටත් සුදුසු බව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභාසම්මතවිය.**

**11(08) යටතේ යෝජනා**

07. ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මයා , ඌරල ,වදුරඹ. විසින් පසුගිය කාල වකවානුව තුලදී රං මාවත් යටතේ ප්‍රතිපාදන වෙන් කිරීමේදී මාගේ ඉල්ලීම පරිදි නැහිණිගල තලාව පාර සඳහා රුපියල් එක් කෝටි තිස් ලක්ෂයක් ලබා දී ඇත. මේ මාර්ගය සංවර්ධනය සභාවේ අනුමැතිය පරිදි රජයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු විසින් සිදු කල අතර, මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කිරීමේදී ඌරල නැහිණිගල පදිංචි අමිත් උඩුගමවිතාන යන අයගේ ඉඩමට හානිවී යයි පවසා බද්දේගම දිසා අධිකරනයේ මා හට නඩුවක් පවරා ඇත. මේ පිළිබඳව මාගේ කිසිඳු සම්බන්ධතාවයක් නොමැති අතර, මෙම මාර්ගය සභාව සතු පාරක් බැවින් ද්වේෂ සහගතව මා හට පවරා ඇති M803දරණ නඩුවේ ගාස්තු වශයෙන් එන්.ඊ.ඩී නයනකීර්ති අබේධීර නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් විසින් එවන ලද ඇස්තමේන්තුවේ සඳහන් නීතිඥ ගාස්තු වශයෙන් රු. 27500.00 ක සම්පූර්ණ මුදල සහ වෙනත් දීමනා ඇතොත් එම දීමනාද සහිතව මා වෙත ලබා දෙන මෙන් මෙම ගෞරවණීය සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

(ඉ) 3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම
(ඉ) 4. මිළ ගණන් ඉදිරිපත් කිරීම

**(ඊ) කාරක සභා වාර්තා**

1. 2023.03.02 දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද ප්‍රසම්පාදන කමිටුවේදී ඉදිරිපත් වූ , නාගොඩ ප්‍රාදේශීය සභා වාහන සඳහා අවශ්‍ය ටයර් මිළදී ගැනීමට ලැබී තිබූ සියළු මිළ ගණන් අවලංගු කොට නැවත මිළ ගණන් කැඳවා නාගොඩ ප්‍රාදේශීය සභා වාහන සඳහා අවශ්‍ය ටයර් මිළදී ගැනීමට 2023.03.14 මහා සභාව විසින් තීරණය කරන ලදී.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

01. 2023 පෙබරවාරි මස ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස ගරු රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රීනී නෙළී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**පෙ.ව 11.30 ට පමණ ගරු සභාපතිතුමා ගරු උපසභාපතිතුමාට සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යාමට පවරා හදිසි කටයුත්තක් සඳහා සභා ගර්භයෙන් පිටවව යන ලදී.**

වෙනත් කරුණු

**ගරු මන්ත්‍රී සමන් නාපෙවිතාන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි.මම හිතන්නෙ මේ සභා වාරය අවසන් සභාවාරය තමයි, ගරු උපසභාපති තුමනි ඔබතුමා උඩුගමට නායකත්වය දීල අපි වෙනුවෙන් විශාල කැපවීමක් කළා.ඒවගේම අපේ අජිත් මහත්මයත් එවැනිම කැපවීමක් කළා.ඒ වෙනුවෙන් එතුමන්ලට ගෞරවණීය ස්තූතිය පුදකරනවා. ඒවගේම තමයි පො.එ.පෙ ආදරණීය සහෝදරවරු විලේගේ අමර ධනංජය, වෙරංග වනිගරත්න සර් ආදීන්ට ස්තූතිය පුදකරනවා නිරන්තරයෙන් එකට සිටීම සම්බන්ධව ඒ වගේම තමයි පක්ෂ භේදයක් තිබුනෙ නැහැ. අපට අපේ තරංග මන්ත්‍රීතුමා චන්ද්‍ර සහබන්දු මන්ත්‍රී තුමා නිරන්තරයෙන් අපි නවක මන්ත්‍රීවරු ලෙස අපට අවවාද දුන්න ඔවුන්ටත් බෙහෙවින් සුතූතිවන්ත වෙනව. ඒවගේම මොන පක්ෂය නියෝජනයකළත් අපේ නන්දන මන්ත්‍රීතුමා ,අජිත් මන්ත්‍රීතුමා අප් අඩුපාඩුවක් දැක්කම අපට උපදෙස් නිරන්තරයෙන් ලබා දුන්න.ඒ වගේම තමයි අපේ වනමල් මන්ත්‍රීතුමත් ඒවගේමයි.මේ දේශපාලන කටයුත්තෙදි පක්ෂභේදයකින් තොරව අපි සැවොම එකාවන්ව කටයුතු කළා.ඒ සම්බන්ධවත් සියළු දෙනාට ස්තූතිය පුදකරන ගමන්ම හෝමදොළ කොට්ඨාශයට අයත් ජනතාවට මම මේ සභාව සඳහා නියෝජනයකරවීමට දායක කරවීම සම්බන්ධව අනේකවාරයක් ස්තූතිවන්ත වෙමින් මා නිහඬ වෙනව ස්තූතියි.

**ගරු උපසභාපති ගාමිණී සුසන්ත මහතා අදහස් දක්වමින්**

සමන් මන්ත්‍රීතුමා හදවතට එකඟව මෙතැනදී ප්‍රකාශයක් කලා. සභාවේ සහයෝගය දැක්වූ සියලු දෙනාටමත් ස්තුති කළා. ඉතින් ඒ නිසා වැදගත් වෙනවා මන්ත්‍රීවරයෙක් වශයෙන් තේරී පත් වීමට, සභාවේ නාමයෝජනා භාරදීමේදීත් එතුමා උඩුගමට නායකත්වයක් දී, ඒ නිවැරදි තීන්දු තීරණ තෝරාගැනීම් අද එතුමන්ව මේ සභාවට සම්බන්ධ වෙලා ඉන්නේ. අපි මේ අවස්ථාවේදී කිසිදු දේශපාලන බෙදීමකින් තොරව, මේ ගමන යන්න මම හිතන්නේ ඔබතුමා අවංකව කටයුතු කළ බව අපි කවුරුත් දන්නවා. ඒ නිසා අපි ඔබතුමාට නැවත වාරයක් මේ සභාව හමුවේ සභිකයෙක් වශයෙන් තමන්ගේ කොට්ඨාසය නියෝජනය කරන්න හැකියාව, ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මේ ආරම්භ කරපු ගමන පසුබට නොවී උද්යෝගිමත්ව, මේ දේශපාලන කරලියේ අපිත් එක්ක රැඳී සිටින්න කියා ප්‍රාර්ථනා කරමින්, මම මේ අවස්ථාවෙ නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියළු දෙනාගෙන් අවසරයි. සමන් මන්ත්‍රිතුමා කිව්වා වගේ ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙන්න ඕන, ප්‍රාදේශීය සභාවට මාව තෝරා පත් කරපු නාගොඩ කොට්ඨාසයේ ජනතාවට. මාව නිර්මාණය කළේ කවුරුවත් පිටිපස්සෙන් ඉඳගෙන නෙවෙයි. ගමේ මිනිස්සු මාව ඕන කියන තැනට යොමු කරලා මාව පත්කලේ. එතනදි මගේ නම යෝජනා කරන්න, අපේ ප්‍රදේශයේ ජනතාවත් එක්ක එකතු වෙලා මම මෙතනට ගේන්න මූලිකව කටයුතු කළේ අපේ පියල් මන්ත්‍රීතුමා. මම එවිට කිසිදු දේශපාලනඥයෙකු සමග සම්බන්ධතාවයක් තිබුණේ නැහැ.

ඒ වගේම තමයි ගරු උප සභාපතිතුමනි සභාවට එන විට මම බලාපොරොත්තුවුනේ අප ප්‍රදේශයේ මත් උවදුරේ අඩුවක් දකින්න. නමුත් කණගාටුයි අද වන විට ඒ තිබුනත් වඩා ප්‍රමාණයක් අයිස් මත්ද්‍රව්‍ය හා ගංජා හැමතැනම තියෙනවා. ඔය වගේම තමයි කසිප්පු ව්‍යාපෘතියත් හොඳටම තියෙනවා. අපට මතක තියෙන කාලයක මත්ද්‍රව්‍ය භාවිත කළේ අවුරුදු 40ත් පැනපු මිනිස්සු. නමුත් අද අවුරුදු 16 - 18 ඉඳලා බොන පිරිසක් ඉන්නේ. ඉස්සර වගේ නෙවෙයි. දැන් අධික විෂ දාලා අවුරුදු දහයක් දොළහක් ඒවා බොනකොට ඒ මිනිස්සුන්ගේ අපේ තරුණ පරපුරට මොකද වෙන්නේ. මම එදත් කිව්වා. අදත් කියනවා නමුත් මම අද කියලා ඒ ගැන කණගාටු වෙනවා. සම්බන්ධීකරණයේදී මම ඒ ගැන කතා කරලා, මට උපහාරයක් ලෙස, මට ගල් පොලු වලින් සංග්‍රහ කරපු රාජ්‍ය නිලධාරීනුත් ඉන්නවා. ඒකට ප්‍රධාන හේතුව අපේ පක්ෂයේ කොන්ද පන නැති නායකයන් නිසා. අපි යම් තැනක මොනව හරි කිව්වොත් ඒකත් ගිහින්

කියන තත්ත්වයක් තමයි තියෙන්නේ. දේශපාලනයෙන් සමුගන්න විශේෂම කාරණාව තමයි ඒක. දේශපාලනික වශයෙන් හොඳ කොන්දක් තියෙන ශක්තිමත් නායකයෙක් ඉන්න ඕන. යම් දෙයක් වුනහම දේශපාලකයෙක් වශයෙන් කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්න ඕන. වර්තමානයේ අපට කර කියාගන්න දෙයක් නැති වෙනවා. මම හොඳටම අසරණ වූ අවස්ථා තිබ්බා. වෙන තැන් වල ගිහිල්ලා වැඩ කරගන්න වුණ අවස්ථා තිබුණා. මගේ ලොකු කනගාටුවක් තියෙනවා. එම මත්ද්‍රව්‍ය ගම් ප්‍රදේශයෙන් නිරාකරණය කරගන්න බැරි වුනාට, මම කියන්නේ කවුරුන් හෝ මත්ද්‍රව්‍ය අප ගම් ප්‍රදේශයෙන් ඉවත් කරන්නට කටයුතු කරනවනම් ඒක ලොකු දෙයක් කියලා. ඒ වගේම තමයි, අපි මේ ගමේ ප්‍රශ්න සම්බන්ධව කතා කරලා, මෙතනින් යනකොට, ඔවුන්ට ඒවා ආරංචි වෙලා මහමග ඉඳලා අපි යන විට ඔවුන් අපෙන් ප්‍රශ්න කරනවා නම්, හම්බ කරන්න දෙන්නෙ නැහැ නේද කියලා. අපට බොහොම කනගාටුවක් දැනෙනවා, මෙතනින් මේවා එළියට යනවා දැක්කම. ඒ වගේම ඇත්තටම මම සතුටු වෙනවා, පක්ෂ විපක්ෂ කෙසේවෙතත්, සහෝදරත්වයෙන් මැතිවරණ කටයුතු කරනවා. ඒ වගේම විශේෂයෙන්ම මතක් කරන්න ඕන. අපේ කොට්ඨාසෙ අපේ මන්ත්‍රීතුමිය අවුරුදු පහක් සභාවෙ හිටියත් විහිළුවටවත් තම බල ප්‍රදේශයේ දී කිසිම තැනකදී මම අපහසුතාවයට පත් කරලා නැහැ. මගෙන් වැරදි දෙයක් කියවුණත්, ඒක නිවැරදි කරලා තේරුම් කරලා කියනවා. ඒ වගේම උපදෙස් දෙනවා. නමුත් අපේ පක්ෂයේම හිටපු සමහර අය අපේ කකුලෙන් ඇදලා අපව නවත්වන්න බැලුවා. මම දේශපාලනයට ඇවිල්ලා සාමාන්‍යයෙන් අවුරුදු එක දෙකක් යන විට මට හිතුනා, නැවත මම දේශපාලනය කරන්නේ නැහැ කියලා. ඒ වගේම ස්තුතිවන්ත වෙන්න ඕන අපේ ප්‍රාදේශීය සභාවේ හිටපු ලේකම්තුමිය ෆර්සියා ලේකම්තුමිය හා චන්ද්‍රිකා ලේකම්තුමියට. අපේ වර්තමානයේ ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරීන්, කම්කරුවාගේ සිට ඉහළම නිලධාරියා දක්වා සියලු දෙනාම දැක්වූ සහයෝගයට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම සභාවෙ ඉදිරියේ දී නොසිටියත්, ඔවුන්ගේ සහෝදරත්වය දිගින් දිගටම රැදෙනවා. නැවතත්, මා මේ සභාවට පත් කළ මගේ කොට්ඨාසයේ ජනතාවට ස්තුතිවන්ත වෙමින්, මට සහය දැක්වූ හා සියලු උපදෙස් දුන් මන්ත්‍රීවරුන්ට හා සියලුම දෙනාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

ගයාන් මන්ත්‍රීතුමා නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් සභාවට ආවා. එතුමා ඊළඟ මැතිවරණයේදී අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වෙන්නේ නැහැ. මේ මැතිවරණය මාස හයකින් දීර්ඝ කලොත් නැවත මැතිවරණ යෝජනා දෙන්න වෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, නැවත ඔබතුමාට සිතක් පහළ වෙලා, අවංක සිතින් ගමට සේවයක් කරන්න ඇවිල්ලා, ගමෙනුත් සහයෝගය ලැබිලා, ඔබතුමාගේ තරුණ ජවය ජනතාවගේ මත්පැන් සම්බන්ධව එක වටින දෙයක් අපි ඔබතුමාට ප්‍රාර්ථනා කරනවා. නැවත වරක් ඔබතුමා අප අතරට ඇවිල්ලා, සභිකයෙකු වශයෙන් ඉහලට එන්න හිතක් පහල වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු උප සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. කොට්ඨාසයේ මන්ත්‍රීධූරයක් සඳහා පත්කර ගන්න මට සහයෝගය ලබා දුන්නේ මගේ කොට්ඨාසයේ ජනතාව. මම ආරම්භක දවසෙදිත් ඒ අයව සිහිපත් කළා. ඒ වගේම මේ අවසන් සභා වාරයේදීත් ඒ අයව අද දින සිහිපත් කරනු ලබනවා. ඒ අයට මගේ ගෞරවණීය ස්තුතිය පුදකරන ගමන්ම, මේ දේශපාලන ගමනට ශක්තියක්, ධෛර්යක් ලබා දෙන්නට ශ්‍රී ලංකා නිදහස් පෙරමුණ නියෝජනය කරමින් ආසනයේ ප්‍රධාන සංවිධායක සම්පත් අතුකෝරල මහත්මා මේ අවස්ථාවේදී සිහිපත් කරනු ලබනවා. විශේෂයෙන්ම අපි දිවුරුම් දීලා මන්ත්‍රීවරයක් ලෙස කටයුතු කරන්නට අපේ දිස්ත්‍රික් නායකතුමා වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා අපට සහාය දැක්වූවා. ඇත්තටම අපි ලොකු බලාපොරොත්තු රැසක් තියාගෙන තමයි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක් හැටියට ආවේ. අපි බොහෝ දේවල් නොදන්න අවස්ථාවක තමයි අපට මේ දේවල් වලට සම්බන්ධ වෙන්නට අවස්ථාව ලැබුණේ. එහිදී අපි බලාපොරොත්තු වන තරම් අපේ සිහින ඉෂ්ට කරගන්න අපට ලොකු අවස්ථාවක් ලැබුණේ නැහැ. මොකද අපට විවිධ කාල පරාසයන් තුළ ලැබුණ විවිධ හේතු නිසා අපගේ ගමන තුළ අපට ලොකු බාධාවල් රැසක් ආවා. ඒ නිසා වෙන්නැති අපට විවිධ

දේවල් ඉෂ්ට කර ගැනීමේ හැකියාව ලැබුණේ නැත්තේ. ඒ නිසා මම හිතනවා ජනතාව වෙනුවෙන් පුළුවන් තරම් දේවල් සිද්ධ කරන්න හැකියාව ලැබෙන්න ඇති, යම් තාක් දුරකට ඒ ගැන අපි සතුටු වෙනවා. කෙසේ වෙතත් ජනතාව වෙනුවෙන් අපේ දේවල් ඉෂ්ඨ සිද්ධ කරගන්න බැරි වුනාට, කරන කියන දේවල් අපි ඉෂ්ඨ සිද්ධ කළා. ඒ නිසා අපි ඒ වෙනුවෙන් ලොකු සහයක් අපේ සභාපතිතුමාට ලබා දුන්නා. අපි නොදන්න කාරණා සම්බන්ධයෙන් දේවල් එන විට, අපේ උප සභාපතිතුමා ගේ හා සභාපතිතුමාගේ සහය අපට නිරන්තරයෙන් ලැබුණා. ඒ ගැන සිහිපත් කරන ගමන්ම, අපි මේ සභාවට එනවිට ජේෂ්ඨ මන්ත්‍රීවරුන් රැසක් මේ සභාව නියෝජනය කරමින් සිටියා. අපට අද වන විට වචනයකින්වත් ප්‍රශ්නයක් නැහැ ඒ අයගෙන්. මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරමින් සිටින මේ කාලය තුළ ඉතා සහයෝගයෙන් එකාවන්ව කටයුතු කළා. ඒක ලොකු සතුටක්. අවු 05 ක කාලපරාසයක් සභාව නියෝජනය කරමින් කටයුතු කළා. ඒ කටයුතු කළ කාලය තුළ අපි සියලු දෙනාම සහෝදරත්වයෙන් කටයුතු කළා. කිසිදු දේශපාලන පක්ෂයක විරෝධතාවය නොමැතිව අපට කටයුතු කරන්න හැකිවීම පිළිබඳව මා බෙහෙවින්ම සතුටු වන ගමන්ම, මට සහයෝගය දැක්වූ සියලු මන්ත්‍රීතුමන් ලා හා මන්ත්‍රීතුමියන්ලාත්, නිලධාරි මණ්ඩලය සහ සේවක පිරිසත් මේ අවස්ථාවේදී සිහිපත් කරමින්, ස්තූතිය පුදකරනවා. ඉදිරියේදී දේශපාලනයට සම්බන්ධ වෙන්න බලාපොරොත්තුවක් නැහැ. ගමේ යම් හෝ දෙයක් වෙනවා නම් එතනදි නොපැකිළව කටයුතු කරන්න සෑම අවස්ථාවකම කටයුතු කරන බව සිහිපත් කරමින්, සම්බන්ධීකරණ නායකතුමාටත්, දිස්ත්‍රික් නායකතුමාටත් ඉදිරියේදී හොඳ සභාවක් නාගොඩ ප්‍රාදේශීය සභාව තුළ ඇති වේවා කියා ප්‍රාර්ථනා කරමින්, සියලු දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

මම හිතන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරිය ගෙන ඒමට ප්‍රධාන හේතුවක් වුණේ ද්‍රවිඩ ජනතාවගේ ආශිර්වාදය විශාල ලෙස ලැබුණා. එමෙන්ම ගමෙන් පත්වෙලා ගමේ නොයෙක් ප්‍රජා සංවිධාන වල හිටපු නිසා තමයි ඔබතුමිය මෙතනට පත්කර ගැනීමට හුදෙක් හේතුවක් වුණේ. අපි බලාපොරොත්තු වෙනවා තවදුරටත් ඔබතුමියගේ සෞඛ්‍ය තත්ත්වය හොඳ වෙලා, නව ගමනක් යාමට, නැවතත් මේ කරළියට ඒමට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. පළමුවෙන්ම මාපලගම කොට්ඨාසය නියෝජනය කරමින්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් මේ සභාවට ඒමට හැකි වුණා. ඒ අනුව 215 අලුත් පහළ, තල්ගස්වල, මාපලගම, කුඹුරුහේන මාගේ ඡන්දදායකයන්ට එම ස්තූතිය පුද කරනවා. මම ඡන්දය ආයෙම ඉල්ලන්නේ නැහැ කියලා හිතා ගත්තා. මීට කලින් කිහිප වතාවක් අපේ හිටපු නායකයා මට ආරාධනා කෙරුවා. බන්දුල මන්ත්‍රීතුමත් දන්නවා. මම ඊට කැමැත්ත දැක්වූයේ නැහැ. විශාල රැල්ලක් මහින්ද රාජපක්ෂ මහතාට තියෙද්දි තමයි අපි ඡන්දය ඉල්ලුවේ. මගේ ඡන්ද කොට්ඨාශය එක්සත් ජාතික පක්ෂ බලකොටුවක්. ඉතාම අසීරුතාවයකින් තමයි ඡන්දය දිනා ගත්තේ, මොකද බත් පැකට් එකට පවා ඡන්දය වෙනස් කරන්න පුළුවන් පරිසරයක තමයි මගේ ඡන්ද කොට්ඨාශය පිහිටලා තිබුණේ. අපි බලාපොරොත්තු වෙච්ච දේවල් අවුරුදු ගාන ඇතුලත කරගන්න බැරිවුනා. අපි සෑම මන්ත්‍රීවරයෙක්ම සභාපතිතුමා, උප සභාපතිතුමා හැර එකොළොස් ලක්ෂ හතළිස් දහසක වැටුපක් අරගෙන තියෙනවා. මේ වන විට අපි ඇත්තට මොනවද කෙරුවෙ කියලා හිතෙනවා. වීථි ලාම්පු ටික විතරයි දාලා දීලා තියෙන්නේ. මහජන මුදල් තමයි වැටුපක් වශයෙන් දෙන්නෙ. මේ අවුරුදු ගානටම මොනවත්ම කරන්න බැරි වුණා. ඒ වගේම අපි මන්ත්‍රීවරුන් සමග චාරිකාවක ගියා, අපි විනෝද වුනා. ඒ වගේම කාර්ය මණ්ඩලය සහ නිලධාරි මණ්ඩලය, සේවක මහත්වරු සමඟ කිසිම දවසක ගැටළුවක් ඇතිකර ගත්තෙ නැහැ. මේ සභාව තිබ්බිච්ච අවුරුදු පහ තුළ සියලු දෙනා සමඟම සහෝදරත්වයෙන් කටයුතු කළා. මම අඩුවෙන්ම කතා කරපු මන්ත්‍රීවරයා වෙන්න ඇති මේ සභාවේ. ඇත්තටම මම මේ සභාවට ඇවිල්ල කරපු දේවල් සම්බන්ධව සෑහීමකට පත්වන්නේ නැහැ. මන්ත්‍රීවරයෙක් වශයෙන් ඇවිල්ලා කරගන්න බැරි වුණ

වැඩ ගැන ඇත්තටම මම පසුතැවිලි වෙනවා. ගරු සභාපතිතුමාටත්, නිලධාරි මණ්ඩලයටත් මට උදව් කලාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

මගේ සභා කාලය තුළ පියල් හිරිමුතුගොඩ මන්ත්‍රීතුමා මැතිවරණයට සභාව ආරම්භයේදීම නොයෙකුත් බලාපොරොත්තු තියාගෙන මන්ත්‍රීවරයෙක් වශයෙන් සේවය කරන්න පැමිණිලා, තමන්ගේ ජනතාවට සේවය කරන්න බැරුව ඉතා අපහසුතාවයට පත් වෙලා තියෙනවා. එතුමා ඒ බව කිව්වා අපටත්, ඒ සියලු කාරණා පොදුයි. අපි නොකිව්වට, ඔබතුමාට තිබුන අපහසුතාවය අපටත් තිබුණා. අපි ඒවත් විඳදරාගෙන මේ කටයුත්තේ යෙදිලා ඉන්නවා. ගරු මන්ත්‍රීතුමාටත් ප්‍රාර්ථනා කරනවා. එදා එම්. එස් අමරසිරි මැතිතුමාගේ බලප්‍රදේශය, ඒක හොල්ලන එක ලේසි වැඩක් වුණේ නැහැ. එතුමාගේ නිවාස යෝජනා ක්‍රම, එතුමා උදව් කලාට නැවත ප්‍රති උපකාරයක් කරන ප්‍රදේශයක ඔබතුමාගේ ජයග්‍රහනය විශාල ජයග්‍රහණයක් ලෙස ප්‍රකාශ කරමින්, ඔබතුමාගේ ඉදිරි ජීවිතය සාර්ථක වෙන්න කියලා ප්‍රාර්ථනා කරන ගමන්, ඔබතුමා දේශපාලනයට සමු දෙන්න එපා කියලා ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි. ඒ වගේම මම ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා, ලක්ෂ 35ක් විතර දැන් සභාවේ මුදල් මම හිතන්නේ ඉතිරිවෙලා තියෙනවා. එම මුදල් වලින් අපේ බල ප්‍රදේශයේ වීථි පහන් ටික වත් දාලා දෙන්න කියලා. වීදි පහන් කට්ටල 150ක් සවි කිරීමේ යෝජනාව සම්මත වුණා. තවම ගෙනැල්ලා නැත්නම් එය ගෙනැල්ලා, හැමෝටම පොදුවේ සවි කරන්න කියලා නැවත වරක් ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රිනී ඉනෝකා නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම මුලින්ම දේශපාලනයට එනවිට දේශපාලනය ගැන කිසිම දැනීමක් තිබුණෙ නැහැ. ඒක නිසා අපි නොදත් කරුණු සියලු දේ දැනගත්තේ විජිත් සහබන්දු මහත්තයගෙන් හා තරංග මන්ත්‍රීතුමාගෙන්. මුල් කාලයේ නම්, වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමාගෙන්. ඊට පසු අවශ්‍ය හැමදේකටම නන්දන මන්ත්‍රීතුමා තමයි සහබන්දු මන්ත්‍රීතුමාට අමතරව අපට අවවාද අනුශාසනා දුන්නෙ. ඒ සියලු දෙනාට ස්තූතිවන්ත වෙනවා. මොකද අපට ඉතිරි වුණේ ඒ හිතවත්කම් විතරයි. අන්තිමට අලුතෙන් විසි හත් දෙනෙක් ආවා. අපට හිතවත් වුණා. ඔවුන්ගේ උවමනාවන් වල දී අපට සහභාගි වෙන්න අවස්ථාව ලැබුණා. ඒ හිතවත්කම් ඉදිරියේ දී පවත්වාගෙන යන්න අපට ශක්තියක් ලැබේවි. සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා වගේ, කාලීන අවශ්‍යතා වලදී අපි සැවොම එකට එකතු වෙන්න අවස්ථාවක් අපි හදාගමු. ඒ වගේම දැන් රටේ පෝලිම් යුගය අවසන් වෙලා තියෙනවා. වර්තමාන ජනාධිපතිතුමා රනිල් වික්‍රමසිංහ මහතාගේ සම්ප්‍රාප්තියත් සමග අපි ගෑස් පෝලිම් ආදී පෝලිම්වල ඉන්න යුගය අවසන් කළා. එතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. මේ අවසාන මොහොතේ සියලු දෙනාට අමතන්න අවස්ථාව ලබාදීම සම්බන්ධව ස්තූතිවන්ත වෙමින්, මා නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයෙන්ද, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. වසර පහක් ගෙවී යන මොහොතක, එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් වචන ස්වල්පයක් කතා කිරීමට කැමතියි. ඇත්තටම මම එක්සත් ජාතික නිදහස් සන්ධානයෙන් තරඟ වැදිලා මෙතනට පත්වුණා. අපේ පක්ෂයේ පියාවගේ සිටිය අජිත් එඬේර ආරච්චි මහත්මයා පක්ෂයෙන් ඉවත් වෙලා වෙනත් පක්ෂයකට ගියා. නන්දන මන්ත්‍රිතුමා දිගටම හිටියා. අපෙ නවක මන්ත්‍රීවරු කිහිප දෙනයි හඳුනා ගත්තෙ. කලින් හිටපු මන්ත්‍රීවරුන් ඉතාම සුහදතාවයෙන් යුක්තව කටයුතු කලා. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී, පියසේන ගමගේ මන්ත්‍රීතුමා තමයි මගේ නම යෝජනා කළේ. ඒ බවත් මතක් කරමින්, ඇත්තටම පක්ෂය හැර දාලා අපි ගියේ නැහැ, ඇයි ඒ වගේම යටලමත්ත යම් සිද්ධියක් වුනේ, යටලමත්ත පක්ෂ තුන නියෝජනය කළා, එක්සත් ජනතා නිදහස් සන්ධානය, එක්සත් ජාතික පක්ෂය, පොදුජන එක්සත් පෙරමුණ, නමුත් යහපාලන කාලේ නන්දන මන්ත්‍රීතුමාත් මමත් ගන්න පුළුවන් උපරිම උත්සාහය ගෙන, කරන්න පුළුවන් උපරිම වැඩ කොටසක් කළා. ඒ ගැන අපි සතුටු වෙනවා. නමුත් මේ

ආණ්ඩුව ආවට පස්සේ අපට වැඩ කරන්න හම්බ වුණේ නැහැ. නමුත් අපි යම් යම් වැඩ කොටසක් කළා. නමුත් මොනවත් ඕන නැහැ. අපට යටලමත්ත පාලම ගැන කතා කරන්න ඕන. සෞඛ්‍ය මධ්‍යස්ථානය ගාව පාලම, වජිර අබේවර්ධන මහත්මයාව මතක් කළ යුතුයි. ඒ අවස්ථාවේ දී මොකද මම සම්බන්ධ නොවුනනම් නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා සමග ඒ පාලම දාගන්න ලැබෙන්නේ නැහැ. අපට ගන්න පුළුවන් උපරිම උත්සාහය අරගෙන යමක් කලා ඉඩම් ආරවුල් සමග. ඒ වගේම තමයි පොදුජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරු පහළොස් දෙනා මුල් කාලයේ දී එකතුවී හැමදේටම ක්‍රියා කළා. ඊට පස්සේ අපට පොඩි පොඩි වැඩ කරන්න හම්බ වුනේ නැහැ. යමක් කතා කළා නම්, ඇත්තටම යටලමත්තේ පොදුජන එක්සත් පෙරමුණමොකද පොදුජන එක්සත් පෙරමුණ කණ්ඩායම ගැන අපේ අජිත් එඬේර ආරච්චි මහතා ඇතුළු මන්ත්‍රීවරු කිව්වා. ඇත්තටම මීට වඩා යහපත් සභාවකට යන්න තිබුණ නම් හොඳයි කියලා. මේ කොට්ඨාස 15 ව එකට එකතු වෙලා, මුලින්ම ඇත්තටම වැඩ කරගන්න බැරි වුණා. අපේ සභාපතිතුමාට ගොඩක් දෝෂාරෝපණ වලට ලක් වෙන්න සිදුවෙලා තිබුණේ. එතුමන්ලා මෙතැනදී ඇහුම්කන් නොදෙන නිසාත්, අපි කිහිප දෙනෙක් විතරයි මෙතනදී යෝජනා ස්ථිර කරන්න නම් දුන්නෙ. මම කියන්නේ දේශපාලන පක්ෂ මොනවත් ඕන නැහැ. මම කියන්නේ සභාපතිතුමා, එතුමාව ආරක්ෂා කරගෙන ඉදිරියට යන්න තිබුණා. දැන් වැඩක් නැහැ. දැන් ගිහිල්ලා ඉවරයි. නමුත් අනාගතයේදී පත්වෙන මොන සභාපති මහත්මයට වුණත් නිසියාකාර වැඩ කොටසකට යන්න හැකිවේවායි ප්‍රාර්ථනා කරන අතර, අපි හැම පළාත් පාලන රැස්වීම් වලට ගිහිල්ලා තියෙනවා. අපි මේ කාන්තාවො හතර දෙනෙක් ඉන්නවා. හතර දෙනා හැමදේටම සහභාගී වුණා. අපට උපදෙස් දුන්නා, යම් යෝජනාවක් ස්ථිර කරනවා නම් හොඳ නරක හොඳින් හොයල බලලා එහි යථාර්ථය කොහොමද කියලා බලලා ස්ථිර කරන්න ඕන. ඒ මොකද එක එක සභා වල්වල පෙර වැරදි කිව්වා. කතරගම සභාවේ යම් වැඩ කොටසක් කරන්න ගියහම, ඒ සභාව විගණන නිලධාරීන් එක්ක ගෙනයන්නේ අම්බලන්ගොඩින් කිව්වා, තමන්ට ඕන විදිහට විගණනය කරගන්නවා කිව්වා. ඒ වගේ අපිත් නිසි ලෙස තීන්දු නොගත්තොත්, අපට විඳවන්න ඕන. දැන් අපේ නිලධාරීන්ට කියන්න තියෙන්නෙ, තමන්ට පවරපු රාජකාරිය නිවැරදිව කරගෙන යන්න. විගණන එනකොට ඒවට උත්තර බඳින්න වෙන්නෙත් ඔබතුමන්ලටයි. එනිසා ලේකම්තුමියත් අවංක නිලධාරිනියක් නිසා නිවැරදිව කටයුතු කරගෙන යන්න කියලා ඉල්ලා සිටිනවා. මේ ආයතන නිලධාරීන්ගෙ නම් කිසිම වරදක් දකින්නේ නැහැ. මම අදත් එකයි. හෙටත් එකයි. එතුමියන්ලට එය හොඳින් කරගෙන යාමට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම හිතන්නේ අද අවසන් සභාවාරය, එක්සත් ජාතික පක්ෂය 2011 මැතිවරණයට සහභාගි වෙලා, එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙක් විදිහට කටයුතු කරලා මම හිතනවා අවසාන අවස්ථාව හැටියට මේ සභාවෙන් නික්මෙන්න හැකිවීම පිළිබඳව මම සතුටු වෙනවා. එක්සත් ජාතික පක්ෂය අවසාන මොහොත වෙනකම්ම යම් වැඩ කොටසක් ප්‍රාදේශීය සභාවෙන් හරි, අපෙන් හරි, කරපු පක්ෂයට සාධාරණයක්, ගමට සාධාරණයක් කරන්න යම් මට්ටමකින් උත්සාහයක් ගත්තා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් විදිහට අපට පහසුකම් නොලැබුණත්, අපේ පක්ෂයේ තිබෙන කාලයේ යම් යම් කොටස් ගම් හරහා අපි සිදු කළා. ඒ පිළිබඳව යම් ආකාරයකින් සතුටු වෙන්න පුළුවන්. ගරු සභාපතිතුමා මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕන, 2018 යම් කණ්ඩායමක් ලෙස පත් කරලා, ප්‍රාදේශීය සභාවට පත් වෙන්න හැකියාව ලැබුණත්, අපේ පක්ෂයේ තීරණය මත, අපේ කණ්ඩායමට හත්දෙනෙක් සභාව නියෝජනය කරමින්, සභාවට පත් කිරීම සඳහා, ඒ වගේම අපේ ආසන සංවිධායක බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා අප සමග නොහිටියත්, ඒ වගේම හිනිදුම ආසන සංවිධායක සුනිල් සේනානායක මහතා අදටත් අපිත් එක්ක ඉන්නවා. එතුමාත් මේ අවස්ථාවේදී මතක් කරමින් මාගේ ස්තූතිය පුදකරනවා. පක්ෂයේ විශ්වාසය රැකගෙන, අපට පුළුවන් උපරිම ආකාරයකින් කිසිදු වංචාවකට හසු නොවී, ඉතා ස්වාධීනව කටයුතු කලා. ඒ වගේම පසුගිය මැතිවරණයේදී 2018

වසරේ ගෝණදෙනිය කොට්ඨාසය තරග කළා. ඡන්ද 702ක් පමණ ජයග්‍රහණය කළා. අපේ විලේගේ මන්ත්‍රීතුමාට 1078ක් පමණ ඡන්ද ලැබුණා. ඡන්ද 300කින් වගේ තමයි කොට්ඨාශ ජයග්‍රහණය කරන්න අපට හැකියාව නොලැබුණේ. උඩුගම කොටසේ වැඩිම ප්‍රතිශතය ලබමින්, මේ සභාව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා. ඒ ගැන ප්‍රදේශයේ අපට සහයෝගය ලබාදුන්, නොදුන් සියලු දෙනාට ස්තූතිය පුද කරනවා. මන්ත්‍රීවරයෙක් විදිහට අපට කරන්න පුළුවන් ආකාරයට, මන්ත්‍රීධුරයක් නොවුනත් අපට කරන්න පුළුවන් දෙයක්, දේශපාලනය හරහා යම් දෙයක් අපේ ප්‍රදේශයට ගමට කලයි කියලා අපි සතුටු වෙනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම සහෝදර මන්ත්‍රී මණ්ඩලය මෙන්ම අපේ සභාපතිතුමා, උප සභාපතිතුමා අපිත් සමග කලින් වැඩ කරපු මන්ත්‍රීවරියො දෙන්නෙක් අයින් වෙලා ගියා. එතුමියන්ලා දෙන්නත් ගෞරවයෙන් සිහිපත් කරනවා. සහෝදරත්වයෙන් මේ සභාවේ කටයුතු කරපු අය ගෞරවයෙන් සිහිපත් කරනවා. මොන දෙයක් තිබුණත් සහෝදරත්වයෙන් අපි එකට එකතු වෙනවා. මොන ප්‍රශ්න වුනත් අපි සියලු දෙනා සහෝදරත්වයෙන් කටයුතු කළා. සභාපතිතුමා, උප සභාපතිතුමා සිහිපත් කරනවා අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, නන්දන, වනමල් අපේ මන්ත්‍රීතුමිය උඩුගම කොටසේ, නාගොඩ කොටසේ ආසන දෙක නියෝජනය කරන ඒ මන්ත්‍රීවරුන්ට සහයෝගය දුන් සියලු දෙනාට මගේ ස්තූතිය පුද කරනවා. විශේෂයෙන්ම උප සභාපතිතුමනි, මේ සභාවේ ලේකම්වරු තිදෙනෙක් යටතේ කටයුතු කරල තියෙනවා. විශේෂයෙන්ම දැන් කටයුතු කරන ලේකම්තුමිය, අපේ නිලධාරි මන්ඩලය, තාක්ෂණ නිලධාරීන්, රියදුරු මහත්වරු, කම්කරු නිලධාරි මහත්ම, මහත්මීන්, සියලුම නිලධාරීන් අපි දෙයක් කිව්වොත් නොසලකා හැරියේ නැහැ. ඔබතුමාගේ උපදෙස් පරිදි ලේකම්තුමිය ගේ උපදෙස් පරිදි අපට කරන්න ඕන හැම දෙයක්ම නොසලකා හැරියේ නැහැ. අපේ රියදුරන්ට ගැටලු ඇති, නිලධාරීන්ට ගැටලු ඇති, මන්ත්‍රීවරුන්ට ගැටලු ඇති, බිලක් අල්ලගෙන කතා කරනවා කියලා හිතනවා ඇති. නමුත් අපි නිවැරදි දේට තමයි හැම නිතරම කතා කළේ. වැරදි දේවල් වැරදි ලෙස මිසක් නිවැරදි ලෙස දැක්කේ නැහැ. සභාවෙන් යම් මුදලක් අරන් දෙන්න හරි වැරැද්දක් වෙලා තියෙනවා නම්, නිවැරදි කරන්න මිසක් අපි සභාවට කවදාවත්ම අඩුවක් වන දෙයක් ගැන කතා කළේ නැහැ. ඉතින් ඒ නිසා ඒ නිලධාරීන්, ඒ සියලුම දෙනාගේ ඒ සහෝදරත්වය ඒ ආකාරයෙන්ම තියෙනවා. ඉතින් ඒ අය අපට පුද්ගලිකව නෙමෙයි, ආරක්ෂා වෙච්ච අවස්ථාවන් තියෙනවා, මොකද ඒ අය සම්බන්ධව දිගින් දිගටම අපි කටයුතු කළා නම්, රැකියා පවා අහිමි වෙන්න තිබුණු අවස්ථා තිබුනා. අපි කෙනෙක්ගේ වැරැද්දක් දැක්කොත්, නිවැරැදි කරන්න උත්සාහ ගත්තා. උපදෙස් ලබා දුන්නා. සමහරවිට ඒක සභාපතිතුමාගෙ වෙන්නත් පුළුවන්, සහෝදර මන්ත්‍රීවරුන්ගෙ සහෝදර නිලධාරීන් ගේ වෙන්නත් පුළුවන් අපි දැනුවත්ව සභාවට කිසිදු දෙයක් (අගතියක්) කළේ නැහැ කියලා අපේ විශ්වාසයක් තියෙනවා. ඉතින් ඒ නිසා කිසි කෙනෙක් අමනාප වෙන්න කාරණයක් නෙමෙයි. ඒ නිසා ඔවුන්ගේ සහයෝගය ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මම මුලින්ම සභාවට ආපු වෙලාවේ අපට සභාවේ සහයෝගය නොලැබෙන වෙලාවේ, පළාත් සභා මන්ත්‍රී සුමනසිරි ලියනගේ මන්ත්‍රීතුමා අපිට ලයිට් ගැන කියනකොට, එක් අවස්ථාවක දී රුපියල් පනස්දාහක් අපට දැම්මා. සභාපතිතුමත් එක්ක ඔයගොල්ලන් ලයිට් ටික සවිකරගන්න කියලා, දහම් පාසල් වලට ගුරු පුටු වගේ දේවල් අපේ කණ්ඩායම හරහා ලබා දෙන්න කියලා. ඒ වගේම පක්ෂ භේදයෙන් තොරව මොන කණ්ඩායමේ හිටියත්, අපේ දිස්ත්‍රික් නායක  වජිර අබේවර්ධන මැතිතුමා නිරන්තරයෙන්ම අපට සහයෝගය දැක්වූවා. ඒ වගේම මොන පක්ෂයේ වුණත් දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දුන්නා. මේ සභාවට අදටත් ඒ සහයෝගය එතුමාගේ දැනුම් දීම හරහා අපට ලැබෙනවා. එතුමන්වත් ගෞරවයෙන් සිහිපත් කරනවා.

අවසාන වශයෙන් කතා කරන්න කැමතියි, මම ඔබතුමාගේ කැබ්රථය සම්බන්ධව නිරන්තරයෙන් මේ සභාවේ කතා වුණා. අපි මොන තරම් උත්සාහ කලාද ඒකෙ තියෙන වියදම් නැති කරන්න. ඒ වගේම කැබ් එක ෆුල් ඉන්ෂුරන්ස් තියන වාහනයක්. හැප්පිච්ච එහෙකට වන්දියක් අරගෙනද දන්නේ නැහැ. නමුත් මම අද එනවිට කැබ් එක වටේම  දැන් ආපු විදිය නෙමෙයි තියෙන්නේ හැම පැත්තම රවුන් වෙලා. මම දන්නෙ නැහැ, කාගෙ අතින් කොහොම මොන විදියට ලැබුණ ද කියලා, අනතුරකට ලක්වෙනවා, රක්ෂණය කරලා තියෙනවා, නමුත් එකේ නියම හිමිකම් අරගෙන, වැරදි නිවැරදි කරලා, හදන්න උත්සාහ කරලා නැහැ. කවුද දන්නෙ නැහැ, රියදුරන්ගේ වැරදිද, කාගේ වැරදිද දන්නේ නැහැ. ඔබතුමා

මේ සභාවෙන් නික්මෙන්න කලින් ඒ කැබ් රථය තිබ්ච්ච තත්වයටවත් දෙන්න උත්සාහ කරන්න. අනිත් වාහන වලටත් එහෙම වෙන්න ඇති, ඒ සම්බන්ධවත් ඒ ආකාරයෙන්ම කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම උප සභාපතිතුමනි මීට වඩා කරුණු කතා කළ යුතු නැහැ. 2018 වර්ෂයේ ඉඳලා අපේ සභාවට පැමිණි අපේ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය සහ නිලධාරීන්ගේ සහයෝගය නැවත වතාවක් සිහිපත් කරමින්, ඉදිරියේ දී මැතිවරණයට තරග කරන්න අපි අත්සන් කරලා තිබුනත් එය අහෝසි වෙන්න ඉඩ තියෙනවා. ඉදිරියේදී මේ සභාවට පැමිණීමට නියමිත අයටත්, ඉදිරියේ දී මේ සභාව නියෝජනය කළත්, නොකළත් අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලා, සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගේ බලාපොරොත්තු වන අපේක්ෂාවන් ඉටුකරගැනීමට ඔබතුමන්ලාට ශක්තිය ධෛර්යය ලැබේවා. ඒ වගේම අපේ සභාවේ සිටින පහළම කම්කරුවාගේ සිට ලේකම්තුමිය දක්වා නිලධාරීන්ගේ අපේක්ෂාවන් ඉෂ්ට සිද්ධ වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, විශේෂයෙන්ම අපෙන් අවවාද අනුශාසනා ඇහුවා කියලා කතා කරපු සහෝදර ඇතැම් මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ට ස්තුති කරමින්, අපි අනාගතයේ සභාවට ආවත්, නාවත්, නිරන්තරයෙන් ඔවුන්ට උදව් කරනවා යැයි සඳහන් කරමින්, සියළු දෙනාට අදට වඩා හොඳ දවසක් ඉදිරියේදී ලැබේවි යන විශ්වාසයෙන් යුක්තව, සියලු දෙනාට වාසනාවන්ත අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්**

වේලාසන වෙනත් කරුණු යටතේ කතා කරලා, වේලාසනින් නික්මයාමේ පරමාර්ථයෙන්, මළ ගෙදරකට සහභාගී වීමට අවශ්‍ය නිසා මම මෙ අවස්ථාව කරගන්නවා සභාව හමුවේ වචන ස්වල්පයක් කතා කිරීමට. මේ දේශපාලනයේ දී වර්තමානයේ දැකපු දෙයක් තමයි මිනිස්සු අපට උදව් කරන්නේ පෞද්ගලිකත්වය, තමන්ගෙකම මත.  අපි කාලය, ශ්‍රමය කැප කිරීම් කරලා තියෙනවා නම්, අපි ඒක අගය කරනවා. ඔබතුමා මේ දේට සම්බන්ධ වුණා. ඔබතුමා අහක බලා ගත්තෙ නැහැ කියලා ගෙවල් එක්දහස් ගණනක් තිබුණු මගේ කොට්ටාශයේ, ගෙවල් නම දාහකට වඩා ඡන්දය දුන්නු මට ඒ අත්දැකීම මත තමයි මේ දැනුත් මලගෙදරට සහභාගී වන්නේ. අත්දැකීම් තව තවත් වර්ධනය කරගන්න,  මම මේ මන්ත්‍රීතුමන්ලාගෙන් මේ සභාව හමුවේ මට ලොකු ප්‍රකාශයක් කරන්න තියෙනවා. මම මේ ප්‍රකාශය යම් කරුණක් දෙකක් කියන්න තමයි බලාපොරොත්තුව. මේ සභාවට ඇවිල්ලා වාඩිවුන වෙලාවේදී  විශාල පීඩනයකට ලක් වුණු මන්ත්‍රීවරයෙක් වශයෙන්, දේශපාලනික වශයෙන්, මේ සභාවේ සිටින ජයග්‍රහණය අනුව මට වැඩිය ජ්‍යෙෂ්ඨයෝ මේ සභාවෙ ඉන්නවා. 1989 අවලංගු වූ නාමයෝජනා පත්‍රයේ අපේක්ෂකයෙක්, ඒ දවස් වල අපි තරුණ කොල්ලෝ. අවුරුදු 17, 18 වගේ. ඊට පස්සේ 1992 මැතිවරණයේදී නාමයෝජනා කැදෙව්වා. අජිත් මන්ත්‍රීතුමා, සහබන්දු මන්ත්‍රීතුමා, නිමල් මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායමක් ජ්‍යෙෂ්ඨයෝ මෙ පළාතෙන් නියෝජනය කලා.ඒවගේම තවත් පිරිසක්  පළාත් සභා මෙන්ම පාර්ලිමේන්තු ගියා. වර්තමානයේ කිසිදු කෙනෙකුට බැරි වුණා එම අවස්ථාව උදා කර ගන්න මේ මැතිවරණ ක්‍රමය හරහා, ඇත්තටම අපි කණගාටු වෙනවා, අතීතයේදී මේ සභාව නියෝජනය කළ ජ්‍යෙෂ්ඨයන් ආකාරයට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව නොලැබීම සම්බන්ධව, ඇත්තටම මම මේ සභාව නියෝජනය කරන්නේ 1997 ආර්ථික ඇමතිතුමා එතුමගේ පුරප්පාඩු නිසා තමයි කොට්ඨාශ ක්‍රමයට පවත්වලා, මුළු සභාවම ඡන්ද තුන් දහස් ගාණක් වගේ නියෝජනයක් ලබා ගත්තේ, 1997- 2011 ඡන්ද දායකයින් මට කියනවා  ඔබතුමාට ඡන්දයක් දුන්නේ ආර්ථික ඇමතිතුමා නිසා කියලා එතුමා මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව මම එතුමට ස්තූතිවන්ත වෙන්න කැමතියි. මා ආ ඒ ගමන් මග මා දන්න තරමින් නොකිලිටි, අවංක ඒවගේම වංචාවෙන්, දූෂණයෙන් තොරව වසර විසිපහක කාලයක් තුළ රැදී සිටීමට හැකි වීම පිළිබඳව මා සන්තෝෂ වෙනවා. අපේ සහබන්දු මහත්මයා කියනවා වගේ, මමත් කියන්නේ  මේ මැතිවරණ ක්‍රමය මහ දූෂිත, නොගැලපෙන මැතිවරණ ක්‍රමයක්. මෙතන ඉන්න මන්ත්‍රීවරු ගැන කියනවා නෙවෙයි, ඇත්තටම මේ සභික සංඛ්‍යාව අඩු වෙන්න ඕන. ඇත්තටම සභාවකට ඔරොත්තු දෙන සභික සංඛ්‍යාවකින් යුක්ත මැතිවරණ ක්‍රමයක් එනවා නම් හොඳයි කියලා මම

හිතනවා. ඒ වගේම මම බලාපොරොත්තු වෙනවා ඉදිරියේදී හරි මෙම ක්‍රමය වෙනස් වෙලා, නව මැතිවරණ ක්‍රමයක් ඒවි කියලා.

ඇත්තටම සභික සංඛ්‍යාව අඩු කාලෙ කරපු දේවල් වලින් දශම භාගයක්වත් වර්තමානයේ කිරීමට හැකි වෙලා නැහැ. ඇත්තටම දැනට කෝටි හතරක් පහක් පමණ ප්‍රමාණයක් මේ අවුරුදු පහ තුළ මේ සභාවට ඇවිල්ල ඇති, වෙන සභාවන් අවසානයේදී කොන්ත්‍රාත් කරලා ඉදිරියටත් ණය ඉතිරි කරලා තමයි නික්ම යන්නේ, සභාපතිවරු ඊළඟ කාලවකවානුව වෙද්දීත් කොන්ත්‍රාත් අරගන්න කොන්ත්‍රාත්කාරයෝ හිටියා, දැන් සල්ලි තිබුනොත් විතරයි කොන්ත්‍රාත් භාරගන්නෙ, දැන් මිනිසුන් පහත් තත්ත්වයට පත්වෙලා, රටත් ඒ වගේමයි. දැන් කිසිදු තැනකින් චෙක් එකකට බඩුවක් ගන්න බැහැ. ඒ තත්වෙට රට පත්වෙලා තියෙන්නේ, විශ්වාසය පලුදු වෙලා තියෙන්නේ. එවැනි තත්ත්වයක් තියාගෙන ගමට ගිහිල්ලා, මම මේ සභාවට තේරී පත්වෙලා, සභාවට ගරුත්වයක් දෙමින්, ගරු සභාපතිවරයාගේ අඩුපාඩුකම් පෙන්වා දුන්නා මිසක, ඔබතුමන්ලාගේ කකුලෙන් අදින්න කිසිදිනක පෞද්ගලික අමනාපකම් මත ප්‍රතික්ෂේප කළේ නෑ. දන්න කියන සියලුම දේවල් යොදවලා ඔබතුමාලගේ දේවල් සම්මත කරලා දුන්නා. මට පොඩ්ඩක් අසාධාරණයක් වුණා, අපේ දේශපාලන නායකත්වය අපේ පක්ෂයෙන් මට නායකත්වය ලැබුණේ නැහැ. මට අවස්ථාවක් දුන්නත්, ඒකත් මට කරගන්න ලැබුනෙ නැහැ. ඒ සියල්ල මගේ යහපත සඳහා කෙරුණා කියලා මම හිතනවා. ඒ නිසා තමයි තවමත් ගමට යන්න හැකියාවක් මට තියෙන්නෙ. මම සියල්ල විඳ දරා ගෙන කටයුතු කළා. ඒක මගේ නොලැබීම කියලා මම හිතනවා. ඒ වගේම දේශපාලනයේ පොදු ධර්මතාවය තමයි දේශපාලනයේදී සහබන්දු මන්ත්‍රීතුමාත් කිව්වා, අපි සුභ සාධකයක් ලෙස ඉදිරියේදී එකතු වෙමු කියලා. ඒ දේ මාත් ලක්රුවන් මන්ත්‍රීතුමා සමඟ කතා කළා. අපි සුභ සාධකයක් කරගෙන යමු යම් ක්‍රමයකට, මොකද අපි පළාත් සභා මන්ත්‍රීවරුන් එක්ක එකතු වෙලා, පුටු අරන් දුන්නා, වළං අරන් දුන්නා, මැෂින් අරන් දුන්නා, ස්වයං රැකියා සඳහා ආධාර අරගෙන දුන්නා. කිසිම ප්‍රතිඵලයක් නැහැ. සුබ සාධකයක් ලෙස පටන්ගෙන සාමාජිකයන්ට තියෙන ආකාරයෙන් කටයුතු කරන්න මොන සමිතියකින්ද ඇගයීමක් තියෙන්නෙ. කරනකන් විතරයි. අපි පුටු ටික යැව්වත් අපිම ගේනකං බලාගෙන ඉන්නවා. මිනිස්සු අපි අතර සමිතියක් හදලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලියා පදිංචි කරලා කරගෙන යමු කියලා ඉල්ලා සිටිනවා. සුහදත්වයෙන් කරගෙන යන වැඩපිළිවෙළක් කරමු කියලා යෝජනා කරමින්, නිරතුරුව සියලු දෙනාගේම අදහස් යෝජනා වැදගත් බව සිහිපත් කරමින්, සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, කෙටි කලකට ඉවත්ව හිටියත්, නැවත ඔබ ගම නියෝජනය කරන පුද්ගලයෙක් ලෙස නැවත පත්ව එන්න කියලා ඉල්ලා සිටිමින්, යහපත් පළාත් සභාවක් හැදිලා, රට ඉදිරියට ගෙන යන්න හැකි වේවි කියල මම හිතනවා. ඒ වගේම ලේකම්තුමිය ඉදිරියටත් ලේකම්වරිය ලෙස ඉඳිවී කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම වර්තමාන සභාපතිවරයාටත් දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ප.ව 2.00 ට පමණ ගරු සභාපතිතුමා නැවත සභා ගර්භයට පැමිණෙන ලදී.**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමනි, සමස්ත සභාවෙන් අවසරයි. අපි යෝජනා ලබා දීලා, අපි උපතේ සිට මරණය දක්වා කටයුතු කිරීමටයි අපි සභාවට ආවේ. අපි බලාපොරොත්තු වුනේ, කොට්ඨාස ජනතාව බලාපොරොත්තු වුනේ, නමුත් මේ මොහොතේ කියවුනේ සමහරුන්ගෙන් සියලු වරප්‍රසාද ලැබිලා සියළුදෙනාගේ බලාපොරොත්තු සාර්ථක වෙනවා වගේ තමයි කතා වුනේ. මට නම් ජේන හැටියට, මම ඊයේ පෙරේදා පත්තරෙත් දැක්කා, බිරිඳ සහ දරුවන් වස බීලා, තාත්තත් වස බීලා මැරුණා. මේ යන ආර්ථික ක්‍රමය මේ ක්‍රමය පාරට ගෙනල්ලා, අපේ නිවිතිගල සහෝදරයෙක් පාරෙ මරලා දැම්මා. ඒවා කිසි කෙනෙකුට මතක නැහැ. මම දැක්කා මේ මන්ත්‍රීවරිය කිව්වා, අපට දැන් කිසි අඩු පාඩුවක් නැහැ, අපි සුවසේ ඉන්නවා කියලා. මම නම් ලයිට් බිල දැක්කට පස්සෙ බය වුනා. දැන් අලුතින් මාපලගම මත්පැන් අලෙවි සලක් දාලා තියෙනවා. ලේකම්තුමිය ඔබතුමියට ඉස්සරහට වැඩ තියෙනවා. දැනටමත් එහා පැත්තේ හිස් බෝතල් ගොඩ ගහලා තියෙනවා. බලන්න කවුද අස් කරන්නේ කියලා. ඒකටත් මුදලක් වැය කරන්න වෙන්නේ සභාවෙන් ම තමයි. බාර් එක ගැන අපි කතා කරන්න යන්නේ නැහැ. ඊට වඩා කතා කරන්න

ඕන පුද්ගලයන් හිටියා. මොකද දන්නෙ නැහැ ඒ අය කටවහගෙන හිටියේ. ඒ ගැනත් මේ මොහොතේ මතක් කරන්න ඕන. මන්ත්‍රීවරුන් දැන් කියනවා අපට පෝලිම් නැහැ කියලා, පෝලිම් නැහැ නෙවෙයි පෝලිම් සීමා කෙරුවා. අපට ඇත්තටම කණගාටුයි, ඔබතුමිය ලා ඔහොම කතා කරන එක සම්බන්ධව, ඔබතුමියලා ඔය කොට්ඨාශ වල ජනතාව පත් කරල දුන්නේ ඔය ටික අහගන්න නෙවෙයි. අපේ සමන් මන්ත්‍රීතුමා කිව්වා වගේ, ඇත්තටම කිසිම අභේනියක් නැතුව තමයි කතා කලේ. එතුමා කිව්ව සත්‍ය කතාව මම පිළිගන්නවා. ඇත්තටම තල්ගස්වල පොලේ කාන්තාවකට ටොයිලට් එකකටවත් යන්න බැහැ, අශෝභන විදිහට තමයි තියෙන්නේ ඒක තමයි ඇත්ත කතාව, ඇත්තටම අපට යෝජනාව ලිඛිතව දීලා කරන්න බැරිනම්.වැඩක් නැහැ.ගරු සභාපතිතුමනි, ලේකම්තුමිය,ඉදිරියෙදි සභාවෙ නායකත්වයක් දරනවා නම්, තල්ගස්වල පොලේ ජලය සම්බන්ධව, පොදු වැසිකිළි ගැටළු ඒ පහසුකම් දෙන්න ඕන. මේ අවුරුදු පහ තුළ සභාපතිතුමාගෙන් අපට කිසිම වරදක් වුණේ නැහැ කියලා සඳහන් කරන්න ඕන. මොකද එතුමා වීදි ලාම්පුවක් දාන්න කිව්වත් අපට ඒක දාල දුන්නා. අපි සියලු දෙනාගේ පරමාර්ථය ගම වෙනුවෙන්, රට වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා හරියට නායකත්වය දන්න නිවැරදි නායකයෙක් පත් කර ගමු කියලා තමයි මම මේ වෙලාවේ දී ඉල්ලා සිටින්නේ. ඒ වගේම තමයි අපට නාගොඩ ප්‍රාදේශීය සභාවේ කම්කරු මහත්මාගේ සිට ලේකම්තුමිය දක්වා වූ තියෙන සහයෝගය වෙනුවෙන් සියලු රාජ්‍ය නිලධාරීන්ට අපේ ගෞරවය, ප්‍රණාමය ජනතා විමුක්ති පෙරමුණ හැටියටත්, ජාතික ජන බලවේගය හැටියටත්, පුද කරමින්, නැවත වාරයක් ඔබ සියලු දෙනාම ඒකරාශී වෙලා, සියලු දෙනාම එකමුතුව ක්‍රියා කිරීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනි ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමනි, අවුරුදු පහක් මේ සභාව නියෝජනය කලත් ගොඩක් ආදායම් උත්පාදනය කරන වැඩපිළිවෙලක් තිබුනත් අපිට එය නිවැරදිව හඳාගන්ඩ බැරිවුනා.ලේකම්තුමිය ඇප්තොප්වත්තෙ කුරුඳු පැල සිටුවලා තියෙනවා. නමුත් මේ අපේ සභා කාලෙදි ඒ ආදායම් ලබාගන්න බැරි වුණා. ලබන වසර වන විට එය අවභාවිතා වන්න නොදී කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඇප්තොප්වත්තෙ කෙසෙල් පැල ටිකක්වත් සිටුවල තිබුන නම් මේ අවුරුදු හතර පහ තුළ ලොකු ආදායමක් ගන්න තිබුණා. ඒ තරමින්වත් ආදායමක් ගැන ඔබතුමා සිතුවෙ නැහැ. ඇත්තටම ඒ ගැන අපි කණගාටු වෙනවා. මම හිතන්නේ අපි ඒ ගැන කතා කරලා වැඩකුත් නැහැ. අපේ ජයවීර මන්ත්‍රිතුමා කිව්වා, හොඳ නායකයෙක් පත්කර ගමු කියලා, රට ගොඩගන්න ඔබතුමාලගෙත් සහයෝගය ලැබෙනවා නම් හොඳයි. ඒ වගේම සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන් ලබාදුන් සහයෝගයට ස්තුතිවන්ත වෙමින්, ඒ වගේම සියලු දෙනාත් එක්ක එකට කටයුතු කිරීම සම්බන්ධව නිලධාරී මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙනවා. ලබන්නා වූ අලුත් අවුරුද්ද සුභ වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, අපි 2018 ප්‍රාදේශීය සභාවට පත්වෙලා, මම හිතන්නේ නාගොඩ ප්‍රාදේශීය සභා ඉතිහාසය තුළ අවසානාවන්තම මන්ත්‍රී කණ්ඩායම අපි කියලා මම විශ්වාස කරනවා. මේ ලෝකයේ කවර කවදාවත් මුහුණු නොදුන්න ඉතාම භයානක කොරෝනා වෛරසයකට මුහුණ දීලා, මම හිතන්නේ අපි පක්ෂ පාට භේදයෙන් තොරව මුලු ලෝකයම වෙලා ගත්තු කොරෝනා වෛරසය නිසා අපි අධිෂ්ඨාන කරගෙන ආපු යම් වැඩ කොටසක් කරගන්න බලාපොරොත්තු වුණත් ඒ කර්තව්‍යය කරගන්න නොහැකි වුණා. අපිට අපේ පෞද්ගලික බලාපොරොත්තුවක් නොතිබුණත්, සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන්න අපි අධිෂ්ඨාන කරගෙන ආවා. මේ සිදුවුන සිදුවීම් දිහා බැලුවම සමහර වෙලාවට රාජ්‍ය තන්ත්‍රය වගේම රටේ මහජනතාවත් ඉතාම අපහසුතාවයට පත්වුණා මේ කාලය කළමනාකරණය කිරීමේදී, ඉතින් ඒ නිසා මම අහන්නේ, 2018න් පස්සේ අවුරුදු එකක වගේ කාලයක් ඉඳලා, ඊට පස්සේ ආණ්ඩුවක් හදා ගත්ත ගමන්ම, කොරෝනා වෛරසයට මුහුණ දීලා ඉතාම අසීරු තත්ත්වයකට පත් වුණා. මේ රටේ සියලු ජනතාවට මම හිතන්නේ දැන් අමතකවෙලා කොරෝනා වෛරසය පිළිබඳව. අපේ සමන් මන්ත්‍රීතුමා කතා කළ විදිහට, අලුතෙන් පත්වුණු මන්ත්‍රීවරුන්ට විධිමත් සභාවක් දැකගන්න ලැබුණේ

නැහැ කියලා කියන්න පුළුවන්. අද දවස වන විට සියලුම කාරණා අවසන් වීගෙන යන මොහොතේ සභා කාලය අවසාන වන විට ප්‍රදේශයේ ජනතාව මහජන නියෝජිතයෙක් ලෙස අපව පත් කරලා, ඔවුන්ගේ බලාපොරොත්තු අපි අතින් ඉටු වුණාද යන්න පිළිබඳවත් අපට ප්‍රශ්නයක් තියෙනවා. අඩු අදායම්ලාභී ප්‍රාදේශීය සභාවක් තුළ මම හිතන්නේ අපට බොහෝ දේවල් බලාපොරොත්තු වෙන්න බැහැ. නමුත් ජනතාව බලාපොරොත්තු වෙන්නේ මන්ත්‍රීවරයෙක් කිව්වම සියලු කාර්ය භාරය ඉටු විය යුතු බවයි. ඉතින් ඒ නිසා අපේ ගරු මන්ත්‍රීවරුන් 27 දෙනෙක් හඳුනා ගන්න ලැබුණා. මේ 27 එකතු කරලා මමත්, සභාපතිතුමත්, උප සභාපතිතුමත් කතා කළා. මේ ජීවත්වන ඉතිරි කාලය තුළ අපි සියල්ලෝම එකතු වෙලා, වැඩපිළිවෙළක් හදාගෙන යනවා. අපි 27 දෙනා මොන පක්ෂයේ වුනත්, මොන මතිමතාන්තර තිබුණත්, අපි 27 ක් විදිහට එකතු වෙලා කටයුතු කරන්න කාලය දැන් ළඟාවෙලා කොට්ඨාශය තුළ අපේ ජීවිතය ගත කරන අවස්ථාවේදී මේ කටයුත්ත කරන්න මම හිතන්නේ මේ අවස්ථාවේදී එම බලාපොරොත්තු ඉතා ඉක්මනින්ම මල්ඵල දරන්නට කටයුතු කරගන්න ඕන කියන දේ සිහිපත් කරමින්, ඒ වගේම සභාපතිවරයා ප්‍රධාන සියලුම දෙනාට ස්තූතිවන්ත වෙනවා, මේ කාර්යභාරය කරගෙන යාමේදී අපට අවස්ථාව ලබාදීම පිළිබඳව ලේකම්තුමිය ප්‍රධාන සියලුම නිලධාරීන්ට ස්තුතිය පුද කරනවා. ඒ වගේම අපි අතින් යම් වරදක් වුනානම් සමාව ඉල්ලනවා. අපි උත්සාහ කළේ නිවැරදි මාවතකට ගන්න. සියලුම සභාවේ නිලධාරීන්ට අපට දැක්වූ සහයෝගයට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. කොරෝනා වසංගතය සමග රටේ තත්ත්වය ඉතා බරපතළ වෙද්දි, හැමදෙනාම වගකිවයුතු අය රටින් පැනලා යද්දි, නොපැකිළව රට කරගෙන යන්න වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා බාරගත්තා. මම හිතන්නේ විපක්ෂ කණ්ඩායම් එක පැයක්වත් සහයෝගය නොදැක්වුවේ නැහැ. නමුත් රටේ තියෙන අස්ථාවරත්වය රට මුදවා ගැනීමට ඔහු යම් කාර්යභාරයක් රටට ඉටු කරනවා. පක්ෂ පාට භේදයෙන් තොරව එතුමා එය සාර්ථක කරගන්න කටයුතු කරනවා. ඒ වගේම යම් කණ්ඩායම් කකුලෙන් අදින්න අර අදිනවා. යම් යම් කාරණයන් බලාගෙන ඉන්න බැරි පිරිස මම හිතන්නේ, ඕනම කෙනෙකුට අවස්ථාව දීලා පක්ෂ පාට භේදයෙන් තොරව රට ගොඩගන්න කටයුතු කරන්න ඕන. ඇත්තටම උඩවැලිවිටිය කොට්ඨාසයේ ජනතාවට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. මාව මෙතනට පත් කරන්න උදවු කළ සියලුම ජනතාවටත්, අපි 27 දෙනාම පත් කිරීමට කටයුතු කල කොට්ඨාස 15 ම ජනතාවට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ක්‍රමානුකූල සභාවක් මේ මැතිවරණයෙන් පසුවවත් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ කතා කළ යුතු බොහෝ දේවල් තිබුණත්, මම යෝජනාවක් කරන්න කැමතියි. සභාපතිතුමනි, ලංකා ගමනාගමන මණ්ඩලයේ, නාගොඩ කොළඹ යන සීටීබී බස් රථය නවත්තලා තියෙනවා. වඳුරඹ, අම්පෙගම, බටපොල, අම්බලන්ගොඩින් කොළඹට යන බස් රථය, එම බස් රථයේ මගින් විශාල පිරිසක් යනවා. මම ඉල්ලීමක් කරනවා, එම බස් රථය නැවත ධාවනයට යොදවන්න කියලා. ඒ වගේම ගාල්ල - කරාපිටිය අවසන් බස් රථය ගාල්ලේ සිට රාත්‍රී 10.00 ට බස් රථය නැවත ධාවනය යොදවන්න ක්‍රියාමාර්ගයක් ගන්න කියල ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, මාපලගම, වඳුරඹ, නාගොඩ, කොළඹ සිට ඇවිල්ලා බොහොම අපහසුතාවයට පත්වෙනවා. ඒ වගේම රාත්‍රී කාලයේ බෙහෙත් ගන්න යන මිනිස්සු මෙතරම් බොහොම ආර්ථිකය අමාරු කාලයක ත්‍රීවිල් රථ වලට මුදල් දීමට නොහැකි පසුබිම මත බස් නැවතුම් පොළවල රාත්‍රිය පහන් කරනවා.

සභාපතිතුමාටත්, ඒ වගේම ගාල්ල කළමනාකරණ සහකාරතුමාටත් බස් රථය දාන්න කටයුතු කරන්න ඒ වගේම ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමක් ලෙස එම යෝජනාවක් කරන්න කියල ඉල්ලා සිටිනවා

මෙය අවසන් සභාවාරය ලෙස කිව්වත් තව වසරක් දීර්ඝ වන බවයි පෙනී යන්නේ. ඒ කොහොම වුණත් මා සමග එකට කටයුතු කළ, මගේ සහෝදර මන්ත්‍රීවරුන් සිහිපත් කරන්න කැමතියි. ඒවගේම මේ සභාවට ආව දවසෙ ඉඳලා ලේකම්තුමිය ඇතුළු සියලු නිලධාරීන් සමග සුහදව කටයුතු කළා. ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින්, ගරු සභාපතිතුමාටත් සුභ පතනවා. ලබන වාරයේ දී ගමට රටට හොඳ වැඩ කොටසක් කිරීමට හැකි මන්ත්‍රීවරු කොටසක් බිහි වී සභාවට පැමිණේවායි ප්‍රාර්ථනා කරමින්, ඒ

වගේම මට උදව් කළ සියලු ජනතාවට නැවත වාරයක් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අමරකීර්ති අතුකෝරල මන්ත්‍රීවරයා ගේ මරණය සම්බන්ධව කතා කරනවානම්, ඔහු පොලොන්නරුවෙ අහිංසක ගොවියෙක්ගේ පුතෙක්, ජීවිතයේ ඉල්ලලා අඩන්නෙ ඒ දරුවා අමු අමුවෙ මරා දානවා. ඊළඟට ඊයේ පෙරේදා කෝච්චියෙදි කූඩයක දාපු දරුවෙක් හමුවුණා. ඒකත් තමුන්නාන්සේලාගේ උපතක්, කොහොමද සමාජය පිරිහිලා තියෙන පිරිහිල්ල. ඔය මැයි නම වෙනිදා සිදුවෙච්ච සිදුවීමකින් තමයි ඔය ළමයා බිහිවෙලා තියෙන්නෙ. තමුන්නාන්සේලාගේ පක්ෂය වර්ධනය කරනවා නම් ඒක මම අනුමත කරන්නේ නැහැ, දරුවට නම දාලා තියෙන්නේ අරගලය කියලා. ඒ වගේම දැන් බඩු මිල පහල ගිහිල්ලා තියෙනවා. පෝලිම් වැඩිවෙද්දී කැමරාව ගිහිල්ලා ඇල්ලුවා. ඒ දවස් වල පෝලිම් වල කට්ටිය කලන්තේ දාලා වැටෙද්දී කැමරා ගිහිල්ලා ඇල්ලුවා. දැනුත් පුළුවන්නේ කැමරාව ගිහිල්ලා අල්ලන්න. සුද්දො ටික එද්දි බයවුණා. ඩොලර් ටික වැටෙනකොට, මේකෙ සංචිතය තහවරු වෙනකොට, හැමෝම බයයි. නමුත් 2030 වෙනකම් රටේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාම තමයි මෙය වාර්තා කොට තබන්න. ඉතින් ඒක නිසා දෙයියන්ගේ නාමෙට ටිකක් ඉවසීමෙන් වැඩ කරන්න. IMF එකෙන් ලබන සතියේ සල්ලි ලැබෙනවාලු. සමගි ජන බලවේගයේ නායකයා සහ ජනතා විමුක්ති පෙරමුණේ නායකයා එහෙ මෙහෙ දුවනවා ලු.

අපි දැන් කරන්ට් එක කපල සීමා කරල තියෙනවා. පෙට්‍රල් වෙනුවට ගමන් අඩු කලා. මම එපොයිමන්ට් එකක් දාලා රෝහලකට ගියා රු.2800.00 බිලේ තියෙන්නෙ, එම රෝහලේ සේවය කරන කෙනෙක් ඔහු දන්නෙ නැහැ මම කවුද කියලා, ආණ්ඩුවෙ හැටි කියලා විවේචනය කරනවා. අන්තිමට කියනවා අපේ උත්සවයක් තියෙනවා තමුන්නාන්සේ නිකන් ඉන්නවනම් ඇවිත් යන්න කියලා, බඩු උගස් තියලා කනකර උගස් තියලා ගිහිපු අහිංසක ලෙඩ්ඩු එතන පෝලිමේ ඉන්නේ. ටයිකෝට් කාරයෝ අපිට මේ බද්ද වැඩියි කියලා බෝඩ් උස්සනවා. බද්ධ ගැහුවා මසකට ලක්ෂයකට වැඩි ආදායම ලැබෙන අයට , අද රෝහල් වහලා දරුණු සැත්කම් වලට ගිහිපු කීප දෙනෙක් අද ජීවිතය හැර දාලා යන්න ඇද්ද? හරින නැමැති වෛද්‍යවරයා තමයි කිව්වේ ඉන්දියාවෙන් සුවසැරිය බස්රථ ගෙන්නුවහම කිව්වා නගින්න එපා කීඹි කන්දෙදි මැරෙයි කියලා කිව්වේ, පසුගිය කාලේ කොරෝනා එනකොට 1990 නොතිබුනානම් අහිංසක අම්මලා, තාත්තලගෙ ජීවිත රැසක් බිලි ගන්න තිබුණා. අහිංසක වෛද්‍යවරු බිල්ලට දීලා කරන දෙය, ස්ටාලින් කියන පුද්ගලයාට සමාජ වෛරයක් ඇති වෙලා තියෙන්නේ. කොහොම හරි අහිංසක දරුවො ටික උගතුන්, බුද්ධිමතුන් ටික පාරට බස්සන්න බැරි වෙනවා. අද අහිංසක දරුවන්ගෙන් පළි ගන්නවා. ගුරුවරුන්ට කලිසම් අන්දලා වෙන මානසික මට්ටමක් හරි ගස්සගෙන යනවා. ඔහු NGO කාරයෙක්. ඔහුට සල්ලි එනවා හෝ ගාලා, හැමදාම පාරෙ මේ වගේ දේවල් තමයි රටේ සිද්ධ වෙන්නේ. බුද්ධියෙන් ඉවසන්න ඕන කාලෙ, බුද්ධියෙන් තොරතුරු ගන්න ඒකයි ඔහු සෙල්ලම් කරන්නේ, ලෙඩ්ඩු ටික තියාගෙන ඔවුන් සෙල්ලම් කරනවා. රටේ අනාගතය බාරගන්න ඉන්න අහිංසක දරුවො ටික පාරවල්වලට බස්සලා, ඒ ගුරු මැණිවරු, පියවරු නොමඟ යවලා, දෙයියන්ගේ නාමෙට මේක බොහොම ප්‍රවේසම් වෙන්න ඕන වෙලාවක්. මොන වික්‍රමය ආවත්, රනිල් වික්‍රමසිංහ මහත්මයා තමයි 2030 වෙනකම් ජනාධිපති. ඒ නිසා ඒ පිළිබඳව වැඩිය කතා කරන්න යන්නේ නැහැ. ඒ වගේම වර්තමාන සභාපතිතුමත්, අපිත් අවුරුදු පහක් වැඩ කළා. තමුන්නාන්සේලාත් වැඩ කළා. හැලහැප්පීම් ආවා, හැලහැප්පීම් නැත්නම් ඒක සභාවක් නෙවෙයි. හැලහැප්පීම් වෙනවා කියන්නේ සභාවේ මොනව හරි සිද්ධ වෙනවා. මොනව හරි සිද්ධ වෙන නිසා තමයි හැලහැප්පීම් ආවේ. වචන හුවමාරුවක් විතරයි අපි සභාවේ දැක්කෙ. පක්ෂ විපක්ෂයේ කාගෙන්හරි සේවයක් සමාජයට වුනානම් හරි සතුටුයි. තමුන්නාන්සෙ කනගාටු වෙනවා නම් ඒකට අපට කමක් නැහැ. තමුන්නාන්සේට වඩා වගකියන්න ඕන තමුන්නාන්සෙගෙ කණ්ඩායම, ඒ ඒ තැන්වලින් තමුන්නාන්සේට අපහසුතාවට පත්වෙන්න සිදුවෙලා තියෙනවා. කොහොම වුනත් අපි පස් අවුරුද්දක් මේ ගමන ඇවිල්ලා, අපට පස් අවුරුද්දක් ලයිට් දැම්මේ නැතත් ප්‍රශ්නයක් නැහැ. මොනදේ වුනත් සතුටු වෙන්න බැහැ. මොකද හදවතේ සතුටු වෙන්න පුළුවන්කම හා සතුටු වෙන්න දෙයක් වෙලත් නැහැ. අපේ සුහදත්වය අපි එළියට බහිනකොට හරි

තියෙනවා. මෙතන ගැටලු ඇතිවුණා. ඒවා ගැන කතා කළා, වාද විවාද වුණා. මේ දොරකඩින් බහින විට ඒ සියල්ල නතර කරලා මෙතනින් බැහැලා ගියා. නැවත මගදි හම්බ වුනාම කතා කළා. මේ හැම ගැටලුවකින්ම සමාජය ගැන කතා වෙන්නේ. අද උප සභාපතිතුමා හොඳ කතාවක් කලා. රස්සාවල් දුන්නත්, මොනා දුන්නත් ගුණය නැහැ. ඒ සම්බන්ධයෙන් නම් මම හොඳට බැට කාපු මිනිහෙක්. මම කොතෙකුත් රස්සාවල් දීලා තියෙනවා. නමුත් එක් පුද්ගලයකු ඇහුවේ නෑ මහත්තයා මොකද වෙන්න ඕනේ කියලා. අක්කර 50 ගානක් බෙදුවා. එක්කෙනෙක් ඇහුවේ නැහැ මොකද මහත්තයා වෙන්න ඕන කියලා. මඩු පුටු මේස දුන්නත් එහි ගුණාත්මක භාවය අපට ලැබෙන්නේ නැහැ. මම මධ්‍යම ආණ්ඩුවෙන් යමක් කරපු නිසා තමයි අද අධිකරණයට යන්නේ. මධ්‍යම ආණ්ඩුවෙන් මුදල් අරගෙන සංවර්ධනයක් ගමට කළා. අපි අද උසාවියට යන්නෙ හරි සතුටින්, මොකද මිනිස්සුන්ට මොනව හරි දෙයක් කරල තියනවා. අපි යන්නේ හොරකම් කරලා නෙවෙයි. ඒ නිසා ඒ ගෞරවය අපේ හදවතේ තියෙනවා. අපේ සුහදත්වය ආරක්ෂා කරගෙන අපි ඔබත් එක්ක කටයුතු කළා. ගරු සභාපතිතුමනි, අපේ බැඳීම තියාගන්න ඕන නම්, විසි හත් දෙනාම එකතු වෙමු. දේශපාලනය හැම තිස්සෙම කරපින්නා ගන්න එපා, ඊට වඩා මේ වෙලාවේ අපිත් එක්ක නිලධාරී වැඩ කළා. අවුරුදු පහක්, ආණ්ඩුවක් යනවිට තව ආණ්ඩුවක් එනවා නිලධාරීන් අපිත් එක්ක වෛරයක් තියාගන්න එපා. ඇත්තටම මම නිලධාරීන් හරියට අඳුරන්නේ නැහැ. ඔබතුමා අපිත් සහභාගී කරගෙන සේවක රැස්වීමක් තිබ්බනම් අපට ඔවුන්ව හඳුනාගැනීමේ හැකියාව තිබුණා. ඒකත් හරි වටිනවා. නිලධාරීන් ගෙන්වලා පෙළ ගස්වලා, මන්ත්‍රී මණ්ඩලයත් පෙළට තියලා මේ ඉන්නේ මගේ නිලධාරි මණ්ඩලය, මේ ඉන්නේ මගේ සභික පිරිස, ඔබතුමාලා ඉතා සහයෝගයෙන් කටයුතු කරන්න කියලා ඔබතුමාට කියන්න තිබුණා. නමුත් එහෙම වුනේ නැහැ. එහෙම නම් සියලු නිලධාරී මණ්ඩලයටත්, අපගේ ගෞරවය පුද කරනවා. ඒ ගැනත් මතක් කරමින්, ඒ වගේම ජේ.සී.බී. යන්ත්‍රය හෙට දිනයේදී වෙන්දේසි කිරීම සම්බන්ධව අපි දැනුවත් නැහැ. ඒ නිසා මේ වෙන්දේසිය සම්බන්ධව මාගේ විරෝධතාවය පලකර සිටිනවා. අවසාන වශයෙන් අපගෙන් මොන යම් අඩුපාඩුවක් වුනානම්, සමාව භජනය කරන්න කියලා ඉල්ලීම් කරමින්, හෙට දවසේත් තමුන්නාන්සේලාගේ දූවා දරුවන් සියලු දෙනාටම යහපත් රටක් හා යහපත් සමාජයක් බිහි වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී එන්. ඩබ්. පතිනායක මහතා**

ගරු සභාපතිතුමා ඇත්තටම අපි වසර පහක පමණ කාලයක් නවක මන්ත්‍රීවරු හැටියට ඉදිරිපත් වෙලා විශාල සේවයක් අපට කරන්නට බැරි වුණත් පුළුවන් ආකාරයට මධ්‍යම රජයේ මුදල්වලිනුත් පළාත් සභාවලින් සුළු මුදලක් ලැබුණේ එම මුදල් වලිනුත් තබා පත්‍ර මාර්ගයේ සම්පූර්ණ අනුග්‍රහය ඇතිව ගමට යම්කිසි සේවයක් කරන්න පුළුවන්කම ලැබුණා. ඒ ගැන යම්කිසි සතුටක් හිතේ තිබුනා. ඒ වගේම කරගන්න තිබුන වැඩ බොහෝයි. ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරන්න තමයි අද කතා කරන්න හිතුවේ. ඒ වගේම ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා, ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමා උපදෙස් ලබා දෙමින්, මේ සභාවේ නවක මන්ත්‍රීවරු හැටියට කරන කටයුතු පිළිබඳව දැනුවත් කිරීමක් කළා. ඒ වගේම හිටපු සභාපතිවරු සහබන්දු මැතිතුමන් ඉන්නේ කොහොමද, මේ සභාවේ කටයුතු කරන්නේ කොහොමද කියලා දැනුවත් කරමින් නිතර කථාබහ කළා. ඒ අයට ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම වාදභේද තිබුණත් ඊට වඩා මෙතනින් යනකොට ඒ සියල්ල ඉවරයි. සියලු දෙනාටම ස්තූතිවන්ත වෙනවා. අපිත් සමග ඒ කටයුතුවලදී ගරු සභාපතිතුමනි, ක්‍රීඩාංගණයේදී 15 වෙනිදා බක් මහ උළෙලක් පවත්වනවා. පුලුවන්නම් වතුර බවුසරය ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා. ගමේ කරන පොදු කටයුත්තක් නිසා මම ඒ ඉල්ලීම කරන්නේ. මේ මන්ත්‍රීවරුන්ගේ සමහර උපදෙස් පිට තමයි යම් දේවල් සිදුවන්නේ. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාගේ සහ සුභාෂි මන්ත්‍රීතුමියගේ ගෙදර ගිනිබත් කරලා තිබුණා. ඇත්තටම එතුමන්ලට මොනවත් සාධාරණත්වයක් ඉටු වුණේ නැහැ. සමහරු කතා කළා. කවුරුවත් සොයා බැලුවෙත් නැහැ. ඒ ගැන කණගාටු වෙනවා. ඇත්තටම අපි එකට ඉන්නවනම් විය යුත්තේ සහෝදර මන්ත්‍රීවරුන් ආරක්ෂා කර ගැනීමයි. මම ඉදිරියේදී ආවත් නාවත් ඇත්තටම ඉන්න මන්ත්‍රීවරුන් තමන්ගේ සහෝදර මන්ත්‍රීවරුන්ට කරදරයක් හිරිහැරයක් වන අවස්ථාවේදී ඉදිරියේදීවත් සොයා බලන්න.

මම හිතන්නේ නව සභා වාරයකට පිවිසෙන්න සිටින සියලු දෙනාට යහපත් හෙටක්, යහපත් කාලයක් උදා වේවා පවතින කලකින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි!

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් සියළු දෙනාගෙන් අවසරයි. කොමසාරිස්තුමා නැවත නාගොඩවිතාන සභාපතිතුමා පත් කරයි ද දන්නේ නැහැ. ඒත් අපට වැඩක් නැහැ. මොකද බලය තිබ්බ්ච වෙලාවෙදිවත් අපට කිසි දෙයක් කළේ නැහැ. ඔබතුමා නැවත ආපස්සට හැරිලා බලන්න මොනවද මම කළේ කියලා. මේ අවුරුදු පහ තුළ කවුරු වෙනුවෙන්ද නියෝජනය කරන්නේ. මොන පක්ෂයෙන්ද නියෝජනය කරන්නේ. ගමේ මිනිස්සු නියෝජනය කරන්නේ මොනවද කියලා. බඩු බෙදුවා නම් මේ ලිස්ට්වලට මේ අවුරුදු පහ තුළම අරගෙන තියෙන්නේ එකම පවුල් ප්‍රමාණයක් පමණයි. ඔබතුමාත් මේ නිලධාරී ගොඩේ හිටියා. අපට ප්‍රශ්නයක් නැහැ. සමහර මිනිස්සුන්ට ඕනවටත් වැඩිය දීලා අපි කියන්නේ ඔබ දීපු එක හරි. දීපු මිනිස්සු ඔබ වෙනුවෙන් පෙනී සිටිනවා ද? හෘද ශාක්ෂියට එකඟව අපි නියෝජනය කරන්න ඕන හරි දේ. අපි යම් පක්ෂයක් නියෝජනය කළා. ඒ පක්ෂය වෙනුවෙන් අපි කඩේ යනවා. හැමදාම එහෙම යන්නත් ඕන. අනිවාර්යෙන්ම සමෘද්ධි කාඩ් එකක් හැදුවනම්, ඇත්තටම බලන්න ඕන ඒක දෙන්න සුදුසු කෙනෙක්ටද දෙන්නෙ කියලා. අනෙක් පැත්තෙන් අපි එකතු කරගන්නෙ මහා පව් කන්දක්. ඇත්තටම පැය 8 හරියට වැඩ කරන රාජ්‍ය නිලධාරීන් අද දකින්න ලැබෙන්නේ නැහැ. ඒ වගේම ඇහුවම කියන්නෙ, මන්ත්‍රී හොරා, ඇමති හොරා, ඔක්කෝම අපහස කරනවා. මම පෞද්ගලිකව දන්නවා එක්කෙනෙක් දෙන්නෙක් ඇරෙන්න, මේ සභාවේ කොන්ත්‍රාත් අරගෙන කළේ නැහැ කියලා. තමන්ගෙ දරුවෙකුටවත් රස්සාවක් ගනිපු නැති මන්ත්‍රීවරු කීදෙනෙක් මේ සභාවෙ ඉන්නවද? හැබැයි මඩ ගහන්නෙ සියලුම දේ ලඟා කර ගත්තු වගේ. මේ සමාජය මන්ත්‍රීවරුන්ට පුදුම විදිහට වෛර කරන්න ගත්තා. මෙතන ඉන්න තරුණ මන්ත්‍රීවරුන්ගේ තාරුණ්‍ය ජීවිතය කැප කරලා ඇවිල්ලා තියෙන්නෙ. නමුත් විදින්න වුනේ අපේ සුභාෂි මන්ත්‍රීතුමිය වගේ තරුණ මන්ත්‍රීවරුන්ට අපහාසයක් අවලාදයක් පමණයි. අපි මේ කියන තත්ත්වයට පත් කළා. අපි දානෙ ගෙදර, මළ ගෙදර කොහේ ගියත් අපි හොරෙක් බවට පත් කළා. අපි මේ සභාවේ වුනත් මේ මිලදී ගැනීම් කරන්නේ මන්ත්‍රීවරුද මේ ගහන ගැහිල්ල නැහැ. නිලධාරීන් කොට්ඨාසයක් අපි කියන්නෙ ලේකම් මිස් මේකට අදාළ නැහැ. මේ මිලදී ගන්නේ එකම සෙට් එකකින්, කවුරු මොනවා කිව්වත් වැඩක් නැහැ. මේවට කතා කරලා වැඩක් නැහැ. වාහන සර්විස් කරන්න ගිහිල්ලා ඒකට මුදලක් ලැබෙනවා නම්, ඒක මේ නාගොඩ ප්‍රාදේශීය සභාවට පමණක් ආවේණික නැහැ. ලංකාවේ තියෙන ක්‍රමයක් ඕක. නමුත් ග්‍රීස්සුත් නැතිව, ඔයිල් ටික මාරු කරන්නෙම නැතුව, ඔයිල් ටිකත් ගහන්නේ නැතුව මුදල විතරක් අරන් එනවා නම්, මේ මිනිස්සුන්ට හරි යනවද? මෙතුමා 12,500ට දාන ලයිට් එක සහබන්දු මහත්තයා කියනවා 7500ට දෙන්නම් කියලා. අපි කරපු එකක්වත් නිවැරදි නැහැ කියන එක මතක් කරමින්, ඒ වගේම ජයවීර මන්ත්‍රීතුමා පක්ෂවල ලොකු කට්ටිය කියන හැමදේම හරි නැහැ. මන්ත්‍රීතුමිය තමන්ට ඔබින තමන්ට නිදහස තියෙන පක්ෂයක වැඩකරලා ස්වාධීනව කටයුතු කරන ගමේ ඉන්න මිනිස්සුන්ට රස්සාවක් දුන්නම හොඳයි. ට්‍රාන්සර් එකක් දුන්නම හොඳ නැහැ. ඔබතුමා සිතන්න මන්ත්‍රීවරුන්ට මා සලකපු විදිහ හොඳයිද? ඔබතුමා තවදුරටත් ඔය පුටුවෙම ඉඳී කියලා අපි හිතනවා. ඒ බවත් සිහිපත් කරමින් මන්ත්‍රීවරුන් අපට දුන් පෞද්ගලිකව සහයෝගීතාවයට ඔබ අපට බොහොම ගෞරවයෙන් කතා කළා. පිළිගැනීමක් දුන්නා. ඒ හැම එකකටම ස්තූතියි. ඒ වගේම සභාවේ ලේකම්තුමිය, නිලධාරීන් අපට කවදාවත් මෙතනට ඇවිල්ල අපහසුතාවයට පත් කළේ නැහැ. මේ කියපු කාරණා වලට සිත් රිදීමක් වුනා නම් සමාවෙන්න කියන ගමන්, මගේ නම් නැවතත් මේ සභාවට මන්ත්‍රීවරයෙක් වශයෙන් එන්න බලාපොරොත්තුවක් නැහැ. මෙතනට එන කවුරුහරි මන්ත්‍රීවරයෙකුට තමන්ට ස්වාධීනව කටයුතු කරන්න පුළුවන් ඒ වගේම තමන්ට ඕන පෞර්ෂය හදාගන්න කියන ඉල්ලීම කරමින්, තමන්ගේ ජීවිත සුභ කරගන්න අවශ්‍ය කටයුතුවල උදව් කරන බව සඳහන් කරමින් සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

සියලු දෙනාගෙන්ම අවසරයි. ගරු මන්ත්‍රීවරුනි, අද දින සභාවේ අවසන් සභාවාරය හැටියට ගත්තේ නීත්‍යානුකූල මට්ටමින්, ඔබ අපි කවුරුත් දන්නවා මාර්තු 19 වෙනිදයින් පස්සේ සභාවල කාලය අවසන් වෙනවා. ඒ සමඟම රාත්‍රී 12.00 වන විට කොමසාරිස් පාලනයට ප්‍රාදේශීය සභා යටත් වෙනවා. ඒ නිසා තමයි මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුව නීත්‍යානුකූලව මැතිවරණයක් ප්‍රකාශයට පත්කරලා පසුගිය නමවෙනිදාට ඡන්දය ප්‍රකාශ කිරීමට තිබුනේ. නමුත් අපි කවුරුත් දන්නවා, වර්තමානයේ ඇති වී ඇති ආර්ථික අර්බුදය හේතුවෙන්, මූල්‍යමය තත්ත්වය දුර්වල වීම හේතුවෙන්, මැතිවරණය දින නියමයක් නොමැතිව කල් ගියා. එය නැවත 25 සුදුසුයි කියලා මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් කියලා තියෙනවා. ඒ අතරතුර තවත් එදිනටත් පවත්වන්න බැහැයි කියන මතවාදයක් ඇති වී තියෙනවා. කොහොම නමුත් ඔබ අප කවුරුත් දේශපාලනයට ආවේ සදාකල් මෙතන රැදෙන්න නෙවෙයි. මමත්, නන්දන මන්ත්‍රීතුමත් දේශපාලනයට ආවේ අහම්බෙන්. මම දේශපාලනයට ආවා මිසක් දේශපාලනයට එන්න හිතාගෙන හිටිය පුද්ගලයෙක් නෙවෙයි. සමාජ සේවය ඇඟේ තිබුණා. අපි යම් යම් තීරණ ක්‍රියාත්මක කිරීමේ දී ඒකාධිපති ස්වරූපයක් ගත්තා. මම සභාවෙ සභාපතිවරුන් තිදෙනෙකු යටතේ වැඩ කරලා තියෙනවා. චන්ද්‍ර සහබන්දු සභාපති තුමාගේ කාලේ තමයි මම 2002 සභාවට ආවේ. නිශාන්ත මහත්තයා, හේමචන්ද්‍ර මහත්තයා, සුසන්ත මහත්මයා, මම ඊළඟට දිසානායක මහත්තයා මේ පැත්තෙ හිටියෙ ඒ 2002 එම් .එම්. දිසානායක මහතා ඊට පස්සෙ හේමචන්ද්‍ර විලේගේ මන්ත්‍රීතුමා සභාපති වුණා. ඒ කාල වකවානුවේ තිබුණේ පක්ෂ අනුව දෙපැත්තෙ වාඩි වුනේ. 2018 නීති ප්‍රකාරව ජේෂ්ඨත්වය අනුව තමයි සියලු දෙනා මෙතන ඉඳගත්තේ. කොහොම නමුත් 2018 මාර්තු මාසේ දිනයක මේ පුටුවෙ ඉඳගත්තේ අද වෙනකම්. සහබන්දු මහත්තයා මට අවුරුදු 5 ක දීර්ඝ ඉතිහාසයක් තියෙනවා මේ නාගොඩ සභාවෙ එදා මන්ත්‍රීවරු දහතුනයි හිටියේ. දැන් 27ටම අපි වගකිවයුත්තා වුනා. අප ප්‍රාදේශීය සභාව අඩු ආදායම්ලාභී සභාවක් හැටියට තමයි නම් කරලා තියෙන්නෙ. ගාලු නගර සභාවේ දවස් 10 ක ආදායම අපේ අවුරුද්දේ එකතු කලත් එකතු කරන්න බැහැ. ඒ වගේ තමයි අපේ සභාව කටයුතු කළේ. ඔබ අපි කවුරුත් දන්නවා මගේ පැත්තට යොමු වෙන දෝෂාරෝපණ නිසා, පළවෙනි අවුරුදු දෙක එක්සත් ජාතික පක්ෂය අවුරුදු දෙකක්. එවිට විපක්ෂය විදිහට අපි ඉන්නේ. අපට ඒ අවස්ථාවේ අපට බලපෑම් කරන්න බැරි වුණා. යම් හරි අස්වැසිල්ලක් තිබුණේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් ලැබුනු මුදල් නිසා ඒ අවස්ථාවේ අපට බලපෑම් කරන්න බැරි වුණා ඇමතිවරුන්ට, ශාන් විජයලාල් මහත්තයාගේ කාලේ අපට නියමිත ආකාරයට මුද්දර ගාස්තු, දඩ මුදල් ලැබුණේ නැහැ. ඊළඟට පළාත් සභා මන්ත්‍රීවරුන් ගෙන් ලැබුණු යම් මුදලත්, ඊට පස්සේ ඊළඟ අවුරුදු දෙකත් කළේ, ජනාධිපතිවරණයක් තිබුණා. පාර්ලිමේන්තු මැතිවරණයත් තිබුණා. ඒ කටයුත්ත කළේ. ඊට පස්සේ අපට කොරෝනා වසංගතය නිසා අවුරුදු දෙකක් අපට මොනවත් කරන්න හැකියාවක් ලැබුණේ නැහැ. ඒ තියෙන මුදලුත් වියදම් කරලා සමාජ සත්කාර කළේ. ඊට පස්සේ අවුරුදු එකක් වැඩි කළා.ඊට පස්සේ ඇවිල්ලා අරියාදු කළා. අරගල නිසා ඔබතුමාලා දන්නවා මෙතනටත් ඇවිල්ලා මේ ප්‍රියංගිකා මන්ත්‍රීතුමියගේ මහත්තයත් ආවා මෙතනට ඇවිල්ලා යම් බලපෑම් කරලා, ගල්වලිනුත් ගහලා වීදුරුවකුත් බිදලා. ඔන්න එවැනි කාල වකවානුවක තමයි අපි ප්‍රාදේශීය සභාව කරගෙන ගියේ. ඒ අතරතුර සභාවට ඇවිල්ලා මම බලෙන් දාගන්න චරිත සුභාෂි මන්ත්‍රීතුමිය, ඒ වගේම ලක්රුවන් මන්ත්‍රිතුමා මේ මන්ත්‍රීවරුන්ගේ නිවාස කුඩු කරලා ගිනි තිබ්බා. මේ දේශපාලන වාතාවරනය තුල මහ තඩ දේශපාලනයක්, අසාධාරණයක් වෙනවා. ගරු මන්ත්‍රීතුමා මේ අපි ඉන්නේ දුප්පත් රටක්, දියුණු රටවල් මේ වන විට ඒ දරන උද්ඝෝෂණ අස්සෙ ප්‍රජාතන්ත්‍රවාදී අපි වගේ නෙවෙයි, හැම රටකම තියෙන්නේ උද්ඝෝෂණ, දැන් අපි හොඳයි. ඒ අපේ රටේ වගේම අනෙක් රටවලත් පෝලිම් තිබුණා. නමුත් දැන් ඒ හැම දෙයක්ම මර්දනය වෙලා, මේ වන විට යම්කිසි ස්ථාවර තත්ත්වයකට ඇවිල්ල තියෙනවා. ඒකට අපි අත් උදව් දෙන්න ඕන. දේශපාලන කෝණයෙන් හිතන්න නරකයි. වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා කෙලින් තීරණ අරගෙන කටයුතු කරනවා. ඒ තීරණ වලට කවුරුවත් මොනවත් කියන්න එන්නෙ නැහැ. ඒක සාධාරණ තීරණයක්. ඒක නොකල බැහැ. චන්ද්‍රිකා මැතිනියත්, හිටපු ජනාධිපතිතුමාත් කියලා තිබුණා, මෙහෙම නැතුව කොහොමද ණය නොගෙන කරන්නේ කියලා. අතීතයේ වැරදි ඇති. නමුත් දේශපාලනය ඇතුලේ යම් දෙයක් රටට කළේ මම හිතන්නේ මේ අවුරුදු 75 තුළ හිටපු දේශපාලනඥයෝ කරපු දේවල් තමයි මේ තියෙන්නෙ. පාසල්,

රෝහල්, මහාමාර්ග මේ දේශපාලන ඇමතිවරුන් කරපුවා තමයි. නිලධාරීන් ම නොවෙයි. ඔබතුමා කියනවා වික්ටර් අයිවන් ජේෂ්ඨ මාධ්‍යවේදී කිව්වා අපි ඩොලර් බිලියන හැටයි ලූ ණය. ලෝකයට ත්‍රස්තවාදීන් විනාශ කරපු දේපළවල වටිනාකම ඩොලර් බිලියන අසූවයි. මම කියන ඒවා නෙවෙයි මේවා, ඩොලර් බිලියන 20 ජනතා විමුක්ති පෙරමුණ විනාශ කරලා තියෙනවාලු. අපි ඒවායේ හොඳ නරක කියන්න යන්නෑ දේශපාලනීකරණය වෙනවා ඒවා, ඒවා අපි කවුරුත් හිතන්න ඕන මේ රටට විනාශකාරී දේවල් කරන්න එපා, අපේම සල්ලි, ඔබතුමාම කිව්ව අපි මේ වියදම් කරන හැම දෙයක්ම ජනතාවගේ සල්ලි, ගෙයක් ගිනි තිබ්බත් ඒක ජනතාවගේ සල්ලි, මම කියන්නේ අපි කවුරුත් එකමුතු වෙලා මේ රට ගොඩගන්නවා මිසක් නැතුව නම් ගොඩගන්න බැහැ. අපේ දේශපාලන පක්ෂ මතවාද තියෙනවා. ගරු මන්ත්‍රීවරුන් මම මේ සභාවේ සභාපති, මෙහෙයුවේ නොදන්නාකමට නෙවෙයි. නීති රීති නොදන්නවා නෙවෙයි. නමුත් මට ඕනකම තිබ්බා මේ සියලු දෙනාමත් එක්ක එකතු වෙලා වැඩ කටයුතු කරන්න. නැත්නම් අලුත් මන්ත්‍රීවරුන් කතා කරලා ඉඩ දෙන්න ඕන. ඒකයි යම් යම් තැන්වලදී නීතිරීතිවලින් එහාට ගිය විදිහට කටයුතු කළේ. නමුත් ඒක මගේ වරදක් නොවෙයි. මගේ දුර්වලකමක් වෙන්න ඇති, ඒ දුර්වලකම මම පිළිගන්නවා, නමුත් මම මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට ඉඩ සලසා දීලා තියෙනවා, තමන්ගේ කොට්ඨාසයේ කටයුතු කරන්න. පසුගිය අවුරුදු 5 තුළ හොඳ හෝ නරක මේ සභාවේ වෙන්න ඇති. මටත් අවුරුදු 20ක දේශපාලන ඉතිහාසයක් තියෙනවා මේ සභාවේ. ඒත් අපි මේ සභාවේ කරපු දේවල් බොහෝයි.ඒවගේම ජේ.සී.බී.යන්ත්‍රය වෙන්දේසි කිරීම සම්බන්ධව අදත් වෙනද වගේම යහපත් ප්‍රතිචාර වගේම අයහපත් ප්‍රතිචාරත් ලැබුන. ඒ කෙසේ නමුත් සභාපති වරයාගේ අවසන් තීරණය පරිදි හෙට දිනයේදී යොදාගත් පරිදි වෙන්දේසියේ කටයුතු අවසන් කරණු ලබන බව සභාපති ලෙස මම මේ සභා වාරයේදී ඔබතුමාලාට දන්වා සිටිනවා. හිටපු සභාපති වරු දෙදෙනෙක් ඉන්නවා. ඒ වගේම උප සභාපතිතුමා ඉන්නවා. මන්ත්‍රීවරු ඉන්නවා. අපි සියලු දෙනාගේ උපදෙස් අදහස් ගැන යම් යම් ප්‍රශ්න ඇති වෙනවා. අද මන්ත්‍රීවරු සත්‍ය කතා කළා. අවංකවම මම වැඩිදුර යමක් කියන්න යන්නේ නැහැ. මම සභාපති වුන දා පටන් මට උදව් කළ මගේ මන්ත්‍රී මණ්ඩලයට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම වැඩබලන වර්තමාන ලේකම්තුමිය සහ ඊට පෙර වැඩ බැලූ ඩිලානි චන්ද්‍රප්‍රභා ලේකම්තුමිය, සමස්ත නිලධාරි මණ්ඩලයටත් ගෞරවනීය ස්තූතිය පුද කර සිටිනවා. ඒ වගේම 2002 ඉඳලා අපට සහය දැක්වූ සියලුම දේශපාලන නායකකාරකාදීන්ට, විශේෂයෙන්ම පියසේන ගමගේ අමාත්‍යතුමා ප්‍රමුඛ යූ.ජී.ඩී. ආරියතිලක මැතිතුමා, නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා, විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා, සම්පත් අතුකෝරාල මන්ත්‍රිතුමා ආදී කොට ඇති සියලු මන්ත්‍රී මණ්ඩලයටත්, ඒවගේම විලේගේ සභාපතිතුමා, සහබන්දු සභාපතිතුමා, අජිත් එඩේරආරච්චි සභාපතිතුමා, එතුමන්ලටත් විලී ගමගේ ඇතුළු ආණ්ඩුකාරතුමන්ලාටත්, ඒ වගේම කොමසාරිස්තුමාන්ලාටත්, වජිර ඇමතිතුමා, ගයන්ත ඇමැතිතුමා, මොහාන් ඇමතිතුමා, බන්දුලලාල් බණ්ඩාරිගොඩ මැතිතුමා, සුසිල් කුමාර මැතිතුමා ආදී කොට ඇති කී නොකී සියලුම දෙනාත්, ඒ වගේම හිනිදුම ආසනයෙන් වැඩිම මනාප අරගෙන හැමදාම මාව තෝරා පත් කරගත් ඡන්දදායකයන්ට ස්තූතිවන්ත වෙමින්, සමස්ථ සේවක මඬුල්ලට, නිලධාරීන්ටත් ගෞරවනීය ස්තූතිය පුද කරමින්, මගෙන් යම් අඩුපාඩුවක් වුනානම් කරන්න දෙයක් නැහැ. නීත්‍යානුකූල ව අවසන් සභාව අදින් අවසන් වෙනවා. එළඹෙන අලුත් අවුරුද්ද සුහම සුභ අලුත් අවුරුද්දක් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම සැම දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ලේකම්,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                        දිනය:-